(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 7(2).]

# පාර්ලිමේන්තුවේ අංක 7 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2012 ඔක්තෝබර් මස 26 වැනි සිකුරාදා**

## 2012 නොවැම්බර් මස 14 වැනි බදාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1407/'11

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විගණකාධිපති දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබූ දිනය කවරේද;

(ii) විගණකාධිපති දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම දෙපාර්තමේන්තුවේ වත්මන් සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) කාර්ය මණ්ඩලයේ පිරවීමට ඇති පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) කාර්ය මණ්ඩලයට හිමි වැටුප් සහ අනෙකුත් දීමනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) විගණකාධිපති දෙපාර්තමේන්තුව දේශපාලනීකරණය වීම පිළිබඳව එක්සත් ජාතීන්ගේ වාර්තාවේ සඳහන්වී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1636/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සුනාමියෙන් විනාශ වූ ගාල්ල මහමෝදර රෝහල යළි ගොඩනැගීම සඳහා රුපියල් මිලියන 3000 ක විදේශ ආධාර මුදලක් ලැබී වර්ෂ පහකට වැඩි කාලයක් ගත වී ඇති බවත්;

(ii) මේ දක්වා එහි ඉදිකිරීම් කටයුතු අත්තිවාරමට පමණක් සීමා වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම රෝහල ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුට රජයේ බදු සහන ලබා දී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රෝහල ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 3000 ක මුදල ලබා දුන් රට කුමක්ද;

(ii) කොන්ත්‍රාත්කරු විසින් එම මුදල් ලබාගෙන රෝහල් ගොඩනැගිල්ල ඉදිනොකිරීම පිළිබඳව සොයා බැලීමට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පරීක්ෂණයක් සිදු කරනු ලැබුවේද;

(iii) එසේ නම්, එහි ප්‍රතිඵලය කවරේද;

(iv) පරීක්ෂණයක් සිදු නොකළේ නම්, ඊට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නැවතත් විදේශීය ණය මුදලක් ලබා ගෙන මෙහි ඉදිකිරීම් කටයුතු කිරීමේ සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, එම ණය මුදල කොපමණද;

(iii) එම ණය මුදල ලබා ගන්නා ආයතනය සහ රට කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1871/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) යාපනයේ පිහිටි ටෙලිකොම් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය සඳහා ඇස්තමේන්තු කළ මුදල කොපමණද;

(ii) එම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේ නම්, ඒ සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කළ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ටෙන්ඩර් පටිපාටිය අනුව අඩුම මිල ගණන් යටතේ ඉල්ලුම්පත් යොමු කළ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එකී ටෙන්ඩරය ලබා දුන් පුද්ගලයාගේ හෝ ආයතනයේ නම සහ ටෙන්ඩරය ලබා දුන් මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට එකී ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා දරන ලද සමස්ත පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2097/'11

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1999 වර්ෂයේ රජයේ ප්‍රමුඛතා කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ 2005 වර්ෂයේ රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ වැඩසටහන යටතේ රාජ්‍ය සේවයට බඳවාගන්නා ලද උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ බඳවාගැනීම් උසස්වීම් ක්‍රමයක් සහිත නිශ්චිත බඳවාගැනීමේ ක්‍රියා පටිපාටියක් යටතේ සිදුකරනු ලැබුවේද;

(iii) ඉහත පරිදි බඳවා ගත් උපාධිධාරීන් සියලුදෙනා අතරින් විධිමත් ක්‍රියා පටිපාටියකට අනුව උසස්වීම් ලබාගැනීමට හැකිවූ උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) රාජ්‍ය සේවයට පිවිසෙන කාර්යාල කාර්ය සහායකවරයෙකුටද මාණ්ඩලික ශ්‍රේණියකට පත්වී විශ්‍රාමයාමට හැකි උසස්වීම් ක්‍රියා පටිපාටියක් පවතින රාජ්‍ය සේවයට බඳවා ගත් උපාධිධාරීන්ට ද නිශ්චිත පටිපාටියක් අනුව උසස්වීම් ලබාදීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2350/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂය වනවිට ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිය ලබා ඇති පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාවන් කවරේද;

(ii) එම පාඨමාලාවන් පවත්වනු ලබන ආයතනවල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාවක් හදාරා ඇති පෙර පාසල් ගුරුවරු සංඛ්‍යාව එක් එක් පළාත හෝ දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2539/'12

ගරු අනුර දිසානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමේ සභාපතිවරයා සහ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ එක් එක් සාමාජිකයා විසින් 2009 වර්ෂයේ සිට මේ දක්වා යෙදී ඇති විදෙස් සංචාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් සංචාරය සිදුකළ රටවල්, ඒවායේ අරමුණු හා ඉන් ලැබුණු ප්‍රතිඵල එක් එක් සංචාරය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් සංචාරය සඳහා ඒ ඒ පුද්ගලයා වෙනුවෙන් වැය කළ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2557/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 සිට මේ දක්වා යුද, නාවික සහ ගුවන් හමුදාවන්හි සේවය අතහැර පලාගිය සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ හමුදා අත්හැර පලාගිය පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට නීතිමය බලය සතු බලධාරීන් කවුරුන්ද;

(iii) 2006 වර්ෂයේ සිට 2011 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ අත්අඩංගුවට ගත් පලාගිය ත්‍රිවිධ හමුදා සමාජිකයින් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2012 ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා කාලය තුළ ත්‍රිවිධ හමුදාවෙන් පලාගිය ගිය අය අත්අඩංගුවට ගැනීම සඳහා වැටලීම් සිදු කරන ලද ප්‍රදේශ කවරේද;

(v) එම වැටලීම් මගින් අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයන්ගේ නාමලේඛනය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2855/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා යුද හමුදාව තුළ දැනටත් සේවය කරන ක්‍රියාන්විත මෙහෙයුම් හේතුවෙන් ආබාධිත වූ සෙබළුන් සහ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) යුද හමුදාවේ සෙබළුන්ට සහ නිලධාරීන්ට විශ්‍රාමගැනීම සඳහා සම්පූර්ණ කළයුතු අවම සේවා කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) යුද හමුදාවේ සේවයෙන් විශ්‍රාම යෑම සඳහා සම්පූර්ණ කළයුතු අවම සේවා කාලයට පෙර විශ්‍රාමයාමට දැනට සේවයේ නියුතු ආබාධිත සෙබළුන්ට සහ නිලධාරීන්ට හැකියාව තිබේද;

(ii) එසේ නම්, එම ආකාරය කවරේද;

(iii) එසේ නොමැති නම්, ආබාධිත හමුදා නිලධාරීන්ට සහ සෙබළුන්ට ඔවුන්ගේ පෞද්ගලික කැමැත්ත මත විශ්‍රාම යෑම සඳහා සුදුසු ප්‍රතිපත්තියක් සකස් කිරීම සුදුසු බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1892/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මනම්පිටියේ සිට වැලිකන්ද දක්වා ඇති දුම්රිය මාර්ග රක්ෂිත ඉඩම් කට්ටිකර විකිණීමේ ජාවාරමක් ක්‍රියාත්මක වන බවත්;

(ii) මෙලෙස අනවසර ලෙස ඉඩම් ලබා දී ඉදිකිරීම් කිරීමට ඉඩහැරීම මගින් දුම්රිය අනතුරු වැඩිවීමේ ප්‍රවණතාවයක් ඇතිවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා එම තත්ත්වය වැළැක්වීමට කටයුතු කරන්නේද;

(ii) එලෙස කටයුතු කරන්නේ නම්, ඊට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2155/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂය තුළදී දේශීය හෝ විදේශීය ආයෝජකයන්ට ලබා දීමට තීරණය කළ හෝ ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් පිහිටි ස්ථාන සහ එක් එක් ඉඩමේ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ආයෝජකයින්ට එම එක් එක් ඉඩම ලබා දීමට හේතු කවරේද;

(iv) එම ඉඩම් ලබා දෙන කාල සීමාව සහ ඉඩම් ලබාදීමේ පදනම කවරේද;

(v) ලබා දුන් හෝ ලබා දෙන එක් එක් ඉඩම වෙනුවෙන් ලැබුණු මුදල හෝ ලැබීමට අපේක්ෂිත මුදල කොපමණද;

(vi) ඉඩම් ලබාදීමෙන් ලැබෙන මුදල යොදාගනු ලබන කටයුත්ත කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2204/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ පහක කාලය තුළ, එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවට අදාළව,

(i) යෙදවූ මුළු ප්‍රාග්ධනය හා සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iii) සේවයේ යෙදවූ මුළු සංඛ්‍යාව, එක් සේවකයකු වෙනුවෙන් දැරූ පිරිවැය සහ එක් සේවකයකුගෙන් ලැබූ ලාභය කොපමණද;

(iv) රජය වෙත ගෙවන ලද අඩු කිරීම් හෝ බදු ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ කවර හෝ මුදලක් කපාහැර තිබේද;

(ii) එසේ නම්, එසේ කපා හරින ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එසේ කරන ලද්දේ කවර හේතුවක් නිසාද;

(iv) එය සිදු කළ දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ එම මුදල් භාවිතා කරන ලද ආකාරයට වඩා වැඩියෙන් ඵලදායී ලෙස ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවට එම මුදල් පරිහරණය කළ හැකිව තිබුනේද;

(ii) එසේ නම්, එය කළ හැකි ආකාරය කවරේද;

(iii) එසේ කළ නොහැකි නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2260/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2012 අයවැය යෝජනා මගින් විශ්වවිද්‍යාල සිසුන් සඳහා දැනට ලබා දෙන මහපොළ ශිෂ්‍යත්ව මුදල වැඩි කිරීමට පියවර ගෙන තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2540/'12

ගරු අනුර දිසානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් 2009 වර්ෂයේ සිට මේ දක්වා යෙදී ඇති විදෙස් සංචාර සංඛ්‍යාව එක් එක් පුද්ගලයාට අදාළව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් සංචාරයට අදාළ වූ රටවල්, සංචාරයේ අරමුණු හා ලැබුණු ප්‍රතිඵල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත එක් එක් සංචාරය සඳහා සහභාගී වූ එක් එක් පුද්ගලයා වෙනුවෙන් වැය කළ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2624/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2007 වර්ෂයේදී ඉන්ධන මිල ඉහළ ගිය අවස්ථාවේදී,

(i) ජනතාවට භූමිතෙල් සහ ඩීසල් සහනාධාර ලබා දුන්නේද;

(ii) එසේ නම්, එක් පවුලක් සඳහා ලබා දුන් භූමිතෙල් සහනාධාරයේ වටිනාකම කොපමණද;

(iii) භූමිතෙල් සහනාධාර ලබාදීමට ප්‍රතිලාභීන් තෝරාගත් ක්‍රමවේදය කවරේද;

(iv) එම භූමිතෙල් සහනාධාරය ලබාදීමට 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂයන්හිදී වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඩීසල් සහනාධාරය ලබා දුන්නේ කා සඳහාද;

(vi) ධීවර ජනතාවටද ඩීසල් සහනාධාර ලබා දෙන බවට පොරොන්දුවක් ලබා දී තිබුණේද;

(vii) එසේ නම්, 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂයන්හිදී ධීවර ජනතාවට ඩීසල් සහනාධාරය ලබාදීමට වෙන් කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් පරිදි ඩීසල් හා භූමිතෙල් සහනාධාර ලබා දී නොමැති නම්, 2007 සිට මේ දක්වා ජනතාව රවටා ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2324/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2004 සිට 2011 දක්වා කාල සීමාව තුළ අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල වාර්තා වූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උතුරු මැද පළාතේ සීඝ්‍රයෙන් ව්‍යාපත්වී ඇති වකුගඩු රෝගයට නිශ්චිත හේතු හඳුනාගැනීම සඳහා උපයෝගී කර ගත් ක්‍රමවේදය කවරේද;

(iii) මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග තුළින් එම රෝග ව්‍යාප්තිය පාලනය වී තිබේද;

(iv) නොඑසේ නම්, එම රෝගය පාලනයට ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වකුගඩු රෝගීන්ට ප්‍රතිකාර කිරීමට අවශ්‍ය පහසුකම් ඇති රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) කොළඹ ජාතික රෝහලේ සහ මහනුවර මහ රෝහලේ ඇති වකුගඩු රෝගීන් සඳහා අවශ්‍ය ශල්‍යකර්ම කිරීමට පහසුකම් සහිත වාට්ටු සංඛ්‍යාව කොපමණද;

(iii) ශල්‍යකර්මවලින් අනතුරුව අවශ්‍ය පහසුකම් යටතේ රජයේ රෝහල්වල රඳවා ගැනීමට හැකි වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) වෙළඳපොලේ පවතින හිඟය නිසා දැනට අධික මිල ගණන් යටතේ අලෙවිකරන වකුගඩු රෝගීන් සඳහා අවශ්‍ය ඖෂධ ප්‍රමාණවත් ලෙස රජයේ රෝහල්වලට ලබා දීමට කටයුතු කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 නොවැම්බර් මස 15 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1893/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, කැකණදුර, ඇල්ලකන්ද වැවේ වැව් බැම්මෙහි ස්ථාන කිහිපයකින්ම ජලය කාන්දුවීමට පටන් ගැනීම නිසා අවට ගම්මානවල පදිංචිකරුවන් ගැටලු රැසකට මුහුණපා ඇති බවත්;

(ii) වැව ප්‍රතිසංස්කරණය කිරීමේදී අදාළ නිලධාරීන් විසින් සිදුකරන ලද අක්‍රමිකතා නිසා එම තත්ත්වය ඇති වී තිබෙන බවට ගොවීන් චෝදනා කරන බවත්;

(iii) ප්‍රදේශයේ ජනතාව විසින් ඉහත තත්ත්වයන් පිළිබඳව අදාළ බලධාරීන්ට දැනුම්දී ඇතත් මේ දක්වා ඊට විසඳුමක් ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කැකණදුර, ඇල්ලකන්ද වැවේ ප්‍රතිසංස්කරණ කටයුතුවලදී සිදු වී ඇති අක්‍රමිකතාවන් පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදුකරන්නේද;

(ii) වැව නැවත ප්‍රතිසංස්කරණයකර ජලය කාන්දුවීම් නැවැත්වීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඊට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2158/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුලියාපිටිය අධ්‍යාපන කලාපයේ, පඬුවස්නුවර අධ්‍යාපන කොට්ඨාසයේ හෙට්ටිපොල ආදර්ශ ප්‍රාථමික විද්‍යාලයේ බහුකාර්ය තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකරන්නේද;

(ii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන සපයාගත් ආකාරය කවරේද;

(iv) එකී ඉදිකිරීම් රජයේ ප්‍රතිපාදන මත සිදු නොකරන්නේ නම්, ප්‍රතිපාදන ලබා දුන් අයගේ නම සහ ලිපිනය කවරේද;

(v) එම ඉදිකිරීම ආරම්භකරන ලද දිනය කවරේද;

(vi) ගිවිසුම් අනුව එහි ඉදිකිරීම් අවසන් කළ යුතු දිනය කවරේද;

(vii) මේ වනවිට එකී ඉදිකිරීම් අවසන්කර තිබේද;

(viii) ඉදිකිරීම් අවසන්කර නොමැති නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2205/'11

ගරු රවී කරුණානායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රාජ්‍ය දැව සංස්ථාවට අදාළව, පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) යෙදවූ මුළු ප්‍රාග්ධනය හා සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iii) කාර්ය මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව සහ එක් සේවකයකු වෙනුවෙන් දැරූ පිරිවැය සහ එක් සේවකයකුගෙන් ලැබූ ලාභය කොපමණද;

(iv) රජය වෙත ගෙවන ලද අඩු කිරීම් හෝ බදු ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ රාජ්‍ය දැව සංස්ථාවට ලබාදුන් කවර හෝ මුදලක් කපාහරිනු ලැබුවේද;

(ii) එසේ නම්, එසේ කපා හරින ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එසේ කරන ලද්දේ කවර හේතුවක් නිසාද;

(iv) එය සිදු කළ දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ එම මුදල් භාවිතා කරන ලද ආකාරයට වඩා කාර්යක්ෂම ලෙස රාජ්‍ය දැව සංස්ථාවට එම මුදල් පරිහරණය කළ හැකිව තිබුණේද;

(ii) එසේ නම්, එය කළ හැකි ආකාරය කවරේද;

(iii) එසේ කළ නොහැකි නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2325/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ස්වේච්ඡා සේවයේ නියුතු ගුරුවරුන් ගුරු සහායකවරුන් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවයේ නියුක්ත කර ඇති බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) ස්වේච්ඡා ගුරුවරුන් ගුරු සහායකවරුන් ලෙස බඳවා ගනු ලැබූ වර්ෂය කවරේද;

(ii) දැනට සේවයේ නියුතු ගුරු සහායකවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ගුරු සේවයේ 3-II ශ්‍රේණියට අන්තර් ග්‍රහණය කරන ලද ගුරු සහායකවරු සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් ගුරුවරයෙකුට දැනට ගෙවනු ලබන මාසික වේතනය කොපමණද;

(v) ගුරු සහායකවරුන්ගේ තනතුරු නාමය වෙනස් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගුරු සහායකවරුන් ලෙස බඳවා ගත් සියලුදෙනා ගුරු සේවයට බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය යටතේ ස්ථිරකර අදාළ ශ්‍රේණියේ වැටුප් තලයක පිහිටුවීමටත්;

(ii) ගුරු සහායකවරුන් ලෙස බඳවාගත් දිනයේ සිට බලපවත්වන පරිදි ඔවුන් සේවයේ ස්ථිර කිරීමටත්;

කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2381/'12

ගරු අනෝමා ගමගේ මහත්මිය,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා විදේශ සේවයේ අනුමත තනතුරු සංඛ්‍යාව එක් එක් ශ්‍රේණිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මේ වන විට,

(i) ශ්‍රී ලංකා විදේශ සේවයේ සිටින තරඟ විභාග සමත්ව සේවයට ඇතුළත්වූ නිලධාරීන් සංඛ්‍යාව ;

(ii) ශ්‍රී ලංකා විදේශ සේවයට පිටස්තරව තානාපති කාර්යාලයන්හි සේවයට බඳවාගෙන ඇති රාජ්‍ය නිලධාරීන් සංඛ්‍යාව;

(iii) ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල සේවය කරන නිත්‍ය රාජ්‍ය සේවයේ නොවන වෙනත් නිලධාරීන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ආ(ii) හා (iii) හි විමසා ඇති නිලධාරීන්ගේ නම්, තනතුරු සහ බඳවා ගෙන ඇති වර්ෂයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ශ්‍රී ලංකා විදේශ සේවයට පිටස්තරව තානාපති කාර්යාල සේවය සඳහා නිලධාරීන් පත් කිරීමේදී අනුගමනය කරන ක්‍රියා පිළිවෙල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2541/'12

ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර සිට බෙලිඅත්ත දක්වා දුම්රිය මාර්ගයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් තිබේද;

(ii) එසේ නම්, එහි මුළු දුර ප්‍රමාණය කොපමණද;

(iii) එහි ඉදිකිරීමේ ටෙන්ඩරය ලබාදී ඇති සමාගම කවරේද;

(iv) එම සමාගම තෝරාගනු ලැබූ පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාතර - බෙලිඅත්ත දුම්රිය මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා වැයවේ යැයි අපේක්ෂිත මුළු මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා ණය මුදලක් ලබා ගැනීමට චීන රජයත් සමඟ ගිවිසුම් අත්සන් කර තිබේද;

(iii) එසේ නම්, එම ණය මුදලේ පොළී අනුපාතය, ණය ආපසු ගෙවිය යුතු කාලය හා වාරික ගණන කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2626/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1990 ඔක්තෝබර් 18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 හි විධිවිධාන 1996 ජූනි 7 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහජන බැංකු සේවකයින් සඳහා අදාළ කරගන්නා බවත්;

(ii) ලංකා බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව තම සේවකයින් සඳහා එම චක්‍රලේඛය අදාළ කරගෙන නොමැති බවත්;

(iii) රාජ්‍ය සේවයේ විශේෂ අවශ්‍යතාවක් වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90, 1996 දෙසැම්බර් 23 දින අවලංගු කළ බවත්;

(iv) එසේ වුවද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 පදනම් කරගෙන මහජන බැංකුව ක්‍රියාත්මක කළ විශ්‍රාම වැටුප් ක්‍රමය මේ දක්වා එම බැංකුව විසින් පවත්වාගෙන යන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 අවලංගු කරන ලද දින සිට ක්‍රියාත්මක වන පරිදි 1996 ජූනි 7 දිනට පෙර තිබූ විශ්‍රාම වැටුප් ක්‍රමය මහජන බැංකු කාර්ය මණ්ඩලය සඳහා නැවත ක්‍රියාත්මක කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2912/'12

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1999 වර්ෂයේ උපාධිධාරී අභ්‍යාසලාභී ගුරුවරුන් ලෙස බඳවාගත් සංඛ්‍යාව කොපමණද යන්න පළාත් අනුව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් උපාධිධාරී අභ්‍යාසලාභී ගුරුවරුන්, 2000 වර්ෂයේදී කළමනාකරණ සහකාර තනතුරුවලට පත් කළ බවත්;

(ii) 2006 වර්ෂයේදී එම පිරිස නැවත ගුරු සේවයට ඇතුළත් කරගත් බවත්;

(iii) එම ගුරුවරුන්ගේ සේවා කාලය ඔවුන් කළමනාකාර සහකාර තනතුරුවලට පත් කළ දින සිට සළකා බලා ගුරු සේවයේ 2 - II ශ්‍රේණියට උසස් කිරීමට අනුමැතිය ලබා දීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කර ඇති බවත්;

(iv) එම චක්‍රලේඛය අනුව පළාත් කිහිපයක ගුරුවරුන්ට ගුරු සේවයේ 2 - IIශ්‍රේණියට උසස්වීම් ලබාදී අදාළ වැටුප් තලයේ පිහිටුවා ඇති බවත්;

(v) මධ්‍යම පළාතේ අදාළ ගුරුවරුන්ට එම උසස්වීම් අහිමි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ආ (ii) හි සඳහන් පරිදි ගුරු සේවයට ඇතුළත් කරගත් මධ්‍යම පළාතේ ගුරු පිරිසටද 2 - II ශ්‍රේණියට උසස්වීම ලබාදීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2948/'12

ගරු ඒ. විනායගමූර්ති මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අද දක්වා කොළඹ ශ්‍රී ලංකා ජාතික රෝහලෙහි හදවත් සැත්කම් කරගැනීම සඳහා පොරොත්තුව සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අතිරේක දැඩි සත්කාර ඒකකයක් සපයනු ලැබුවහොත් ඉහත රෝහලෙහි දිනකට සිදුකරන හදවත් සැත්කම් සංඛ්‍යාව වැඩි කළ හැකිද යන්නද එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත කී රෝහලට අතිරේක දැඩි සත්කාර ඒකකයන් ලබාදීමට අවශ්‍ය පියවර ගැනීමට එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2950/'12

ගරු අජිත් කුමාර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සමෘද්ධි නිලධාරී සුභසාධක අරමුදල ආරම්භ කළ දිනය කවරේද;

(ii) ආරම්භයේ සිට මේ දක්වා එම අරමුදලට බැරවී ඇති මුළු මුදල කොපමණද;

(iii) 2012 ජුනි 30 දිනට එම අරමුදලින් ගෙවීම් කර ඇති නිලධාරීන් සංඛ්‍යාව, ඔවුන්ට ගෙවා ඇති මුළු මුදල සහ අරමුදලේ ශේෂය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම අරමුදලෙහි,

(i) මුදල් භාවිතා කළ හැකි කාර්යයන්;

(ii) නීතිමය තත්ත්වය විග්‍රහ කරන පනත් හා රෙගුලාසි;

(iii) සාමාජිකයෙකුගේ සුභසාධක ඉල්ලීමකට අදාළ ගෙවීම සිදුකිරීමට ගතවන කාලය;

(iv) සමාජිකයෙකුට හිමි ගෙවීම සිදුකිරීමේදී නියමිත කාලය ඉක්ම යන්නේ නම් ඊට හේතු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සමෘද්ධි නිලධාරී සුභසාධක අරමුදල භාවිත කර වෙනත් ආයෝජන සිදුකරනු ලබන්නේද;

(ii) එසේ නම්, ආරම්භයේ සිට මේ දක්වා සිදුකළ ආයෝජනයන්ගෙන් උපයාගෙන ඇති ලාභය කොපමණද;

(iii) එම ලාභ බෙදීයන පාර්ශ්වයන් කවරේද;

(iv) එම එක් එක් පාර්ශ්වයන් වෙත බෙදීයන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1894/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරන මාකඳුර නගර සංවර්ධන සැලසුම යටතේ හරිත නගරයක් හා හරිත ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කළත්, මේ වනවිට එහි ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙහි ඉදිකිරීම් නවතා දැමීමට හේතු කවරේද;

(ii) එම ඉදිකිරීම් සඳහා අරමුදල් සපයන ලද ආයතනය හෝ ආයතන කවරේද;

(iii) ඒ සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) හරිත නගරය හා හරිත ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් නැවත ආරම්භ කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2159/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යටතේ පාලනය වන වතු සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් වත්තේ සේවය කරන සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සේවකයින් වෙනුවෙන් මසක දී සේවක අර්ථසාධක අරමුදලට බැර කළ යුතු මුදල කොපමණද;

(ii) ඒ අනුව මේ වනවිට සේවක අර්ථසාධක අරමුදලෙහි තැන්පත් කර ඇති මුදල කොපමණද;

(iii) නිසි පරිදි එකී අර්ථසාධක මුදල් තැන්පත් කිරීම් සිදුකර නොමැති නම්, එක් එක් වත්ත අනුව ගෙවීමට ඇති හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) සමස්ත හිඟ මුදල කොපමණද;

(v) ඉහත හිඟ මුදල කවර කටයුත්තක් සඳහා යොදවා තිබේද;

(vi) එම හිඟය පියවන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2206/'11

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට සිටින කැබිනට් අමාත්‍යවරු සංඛ්‍යාව සහ එම අමාත්‍යවරුන්ගේ නම් කවරේද;

(ii) ඉහත සඳහන් අමාත්‍යාංශවලට 2012 අයවැයෙන් වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත සඳහන් ප්‍රතිපාදන දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) එම අමාත්‍යාංශවල සේවය කරන සමස්ත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(v) එක් අමාත්‍යාංශයක් වෙනුවෙන් මසකට දරන මුළු වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් අමාත්‍යාංශ අතරින් කිසියම් අමාත්‍යාංශ සංඛ්‍යාවක් අහෝසි කිරීම හෝ අඩු කිරීම සිදු කළ හැකිද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2326/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006.09.11 දින ආරම්භ කරන ලද රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය දියුණු කරන බවටත්;

(ii) අනෙකුත් වෛද්‍ය පීඨවල 2005-2006 ශිෂ්‍ය කණ්ඩායම් සමග රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටද සීමාවාසික පත්වීම් ලබාදෙන බවටත්;

ජනාධිපතිතුමා පොරොන්දු වූ බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) අනෙකුත් වෛද්‍ය පීඨයන්හි ඇති පහසුකම් රජරට වෛද්‍ය පීඨය තුළද ප්‍රමාණවත් ලෙස ස්ථාපිත කර තිබේද;

(ii) රජරට වෛද්‍ය පීඨයේ මහාචාර්ය සායනික පුහුණුවට අවශ්‍ය ගොඩනැගිලි ඇතුළු සියලු පහසුකම් මේ වන විට ස්ථාපිත කර තිබේද;

(iii) 2011 මැයි මස මහාචාර්ය සායනික පුහුණුව සඳහා යොමුකළ යුතුව සිටි සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වන විට ඔවුන් එම පුහුණුව ආරම්භකර තිබේද;

(v) නොඑසේ නම් ඒ සඳහා සිසුන් යොමු කිරීමට ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2542/'12

ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල සිට මාතර දක්වා දුම්රිය මාර්ගයේ අලුත්වැඩියා කරන කොටසේ දිග කොපමණද;

(ii) එම දුම්රිය මාර්ගය අලුත්වැඩියාකිරීමේ ව්‍යාපෘතිය භාර දී ඇති සමාගම තෝරාගනු ලැබූ පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතියේ එකඟතාවන්ට අනුව ඉවත් කරන ලද පැරණි රේල් පීලිවල අයිතිය ලැබිය යුතු අය කවුරුන්ද;

(ii) ඉවත් කරන ලද රේල් පීලි අලෙවි කරනු ලැබුවේද;

(iii) එසේ නම්, එම රේල් පීලි මිලදී ගත් අය කවුරුන්ද;

(iv) රේල් පීලි අලෙවිකරන ලද මිල හා අලෙවියෙන් ලැබූ මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 නොවැම්බර් මස 16 වැනි සිකුරාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1895/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය අධ්‍යාපන කලාපයට අයත්ව තිබූ යාය ගාමිණී කණිෂ්ඨ විද්‍යාලය වසා දමා වර්ෂ ගණනාවක් ගතවී ඇති බවත්;

(ii) මෙම විද්‍යාලය සතුව පැවති ගොඩනැගිලි කිහිපයක් මේ වනවිට විනාශ වෙමින් පවතින බවත්;

(iii) එම විද්‍යාලය සතුව අක්කර හතක පමණ භූමි ප්‍රමාණයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) යාය ගාමිණී කණිෂ්ඨ විද්‍යාලය සතු ගොඩනැගිලි සහ භූමි භාගය විනාශයට පත්වීමට ඉඩහැරීම ජාතික අපරාධයක් බවත්;

(ii) එම විද්‍යාලය සතු සම්පත් යොදා ගනිමින් කර්මාන්තශාලාවක් ආරම්භකර ප්‍රදේශයේ ජනතාවගේ රැකියා ප්‍රශ්නයට විසඳුම් සැපයිය හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, එම පාසලේ සම්පත් මතු යෝජිත පරිදි යොදා ගැනීමට සැළසුම් කරන්නේද;

(ii) නොඑසේ නම්, වෙනත් ඵලදායී කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම කටයුත්ත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1986/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මේ වනවිට රජය සතු පෞද්ගලික සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමාගම්වල නම් සහ ඒවා අදාළ වන අමාත්‍යාංශය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම එක් එක් සමාගම්වල ශ්‍රී ලංකා රජය සතු කොටස්වල ප්‍රතිශතය සහ පෞද්ගලික අංශය විසින් ආයෝජනය කර ඇති කොටස්වල ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) පෞද්ගලික ආයෝජකයින්ගේ නම් සහ ලිපිනයන් එක් එක් සමාගම අනුව කවරේද;

(vi) එම එක් එක් සමාගම 2009 සහ 2010 වර්ෂවලදී ලබා ඇති ශුද්ධ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2207/'11

ගරු රවී කරුණානායක මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට අදාළව, පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) යොදවන ලද මුළු ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) සමස්ත කාර්ය මණ්ඩලය කොපමණද;

(iii) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iv) එක් එක් සේවකයාට අදාළව ලාභය හෝ අලාභය කොපමණද;

(v) බදු හෝ තීරු බදු ලෙස රජයට ගෙවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ දෙකක කාලය තුළ රාජ්‍ය ආයතන විසින් රූපවාහිනී සංස්ථාවට ගෙවිය යුතුව තිබූ මුදල් ප්‍රමාණය එම ආයතනවල නම් සහ ඒවා විසින් ගෙවිය යුතුව තිබූ මුදල් ප්‍රමාණයන්ද සමගින් කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2327/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2000 සිට 2011 දක්වා කාල සීමාව තුළ රු. 900 හා රු. 1,500 ලෙස සහනාධාර ලැබූ සමෘද්ධිලාභීන්ගෙන් සමෘද්ධි බැංකු හරහා වාර්ෂිකව අයකර ගෙන ඇති අනිවාර්ය ඉතිරිකිරීම් මුදල් ප්‍රමාණයන්;

(ii) අනිවාර්ය ඉතිරිකිරීම් අයකර ගත් එම සමෘද්ධිලාභීන් අතරින් මේ වන විට සමෘද්ධි දීමනාව කපා හැර ඇති සංඛ්‍යාව;

(iii) එසේ සමෘද්ධිය කපා හැරි සමෘද්ධිලාභීන් අතරින් මේ වන විට අනිවාර්ය ඉතිරිකිරීම් ආපසු ලබාගෙන ඇති සංඛ්‍යාව;

(iv) එසේ ගෙවන ලද මුළු මුදල;

(v) මේ වනවිට සමෘද්ධිය අහිමිකළ සමෘද්ධිලාභීන් අතරින් අනිවාර්ය ඉතිරිකිරීම් ආපසු ගෙවීමට ඇති පවුල් සංඛ්‍යාව;

කොපමණද යන්න දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමෘද්ධි වැඩසටහනින් ඉවත්වූ සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතිරිකිරීම් ආපසු ගෙවා අවසන් කිරීමට ගතවන කාලය කොපමණද;

(ii) දැනට මියගොස් ඇති සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතිරිකිරීම් ගෙවීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියා පටිපාටිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2543/'12

ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ධාවනය වන දුම්රියවලට දුම්රිය මැදිරි අමුණාගෙන යාමට පෞද්ගලික සමාගම්වලට අවසර ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම සමාගම්වල නම් කවරේද;

(iii) එම සමාගම් තෝරාගනු ලැබූ පදනම කවරේද;

(iv) එම එක් එක් සමාගමට අමුණාගෙන යෑම සඳහා අවසර ලබාදී ඇති දුම්රිය මැදිරි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පෞද්ගලික සමාගම් සතු දුම්රිය මැදිරියකින් කොළඹ සිට මහනුවර දක්වා ගමන් කිරීමට අයකරනු ලබන ගාස්තුව එක් එක් සමාගම අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අයකරනු ලබන එම මුදලින් දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබෙන මුදල කොපමණද;

(iii) පෞද්ගලික සමාගම් විසින් අමුණා ධාවනය කරනු ලබන දුම්රිය මැදිරි එම සමාගම් විසින්ම ආනයනය කරනු ලැබූ ඒවාද;

(iv) නොඑසේ නම්, ඒවායේ පෙර අයිතිය දුම්රිය දෙපාර්තමේන්තුව සතුව තිබුනේද;

(v) එසේ නම්, පෞද්ගලික සමාගම් වෙත එම මැදිරි පැවරීම ටෙන්ඩර් කැඳවීමකින් පසුව සිදු කළේද;

(vi) එසේ නම්, එම මැදිරි ලබා දුන් මිල ගණන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2696/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2003 වර්ෂයේ සිට මේ දක්වා වාද්දුව, තල්පිටිය මාදැල් වරාය තුළ අබලන් වූ බත්තලක් නවතා ඇති බවත්;

(ii) එම බත්තල හේතුකොට ගෙන තල්පිටිය මාදැල් වරායේ ධීවර කටයුතුවලට බාධා පැමිණෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් බත්තලෙහි හිමිකරු කවුරුන්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම බත්තල තල්පිටිය මාදැල් වරායෙන් ඉවත් කොට එම වරායේ ධීවර කටයුතු යථාතත්ත්වයට පත් කිරීමට ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2949/'12

ගරු ඒ. විනායගමූර්ති මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතෙහි රෝහල්වල ප්‍රතිකාර ලබාගන්නා මානසික බලපෑම්වලට ලක් වූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එකී මානසික බලපෑම්වලට ලක්වූ පුද්ගලයන් ආබාධිත පුද්ගලයන් ලෙස සැලකිය හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උතුරු පළාතේ ඉහත කී මානසික බලපෑම්වලට ලක්වූ පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීමට යම් වැඩසටහන් තිබේදැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2951/'12

ගරු අජිත් කුමාර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල ආරම්භ කරනු ලැබූ දිනය කවරේද;

(ii) ආරම්භක දිනයේ සිට මේ දක්වා එම අරමුදලේ සාමාජික සංඛ්‍යාව සහ ඊට ලැබුණු මුදල, සමෘද්ධි සහනාධාර නිකුත් කළ කාර්තු අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2012 ජුනි 30 දිනට එම අරමුදලේ ශේෂය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම අරමුදලෙහි,

(i) මුදල් භාවිතා කළ හැකි කාර්යයන්;

(ii) ආරම්භයේ සිට මේ දක්වා එහි මුදල් භාවිතා කර ඇති කාර්යයන්;

(iii) නීතිමය තත්ත්වය විග්‍රහ කරන පනත් හා රෙගුලාසි;

(iv) සාමාජිකයෙකුගේ සමාජ ආරක්‍ෂණ හිමිකමක් සඳහා වන ඉල්ලීමකට අදාළ ගෙවීම සිදුකිරීමට ගතවන කාලය;

(v) සමාජිකයකුට හිමි ගෙවීම සිදුකිරීමේදී නියමිත කාලය ඉක්මවා යන්නේ නම්, ඊට හේතු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල භාවිත කර වෙනත් ආයෝජන සිදුකර තිබේද;

(ii) එසේ නම්, ආරම්භයේ සිට මේ දක්වා සිදුකළ ආයෝජනයන්ගෙන් උපයාගෙන ඇති ලාභය කොපමණද;

(iii) එම ලාභ බෙදීයන පාර්ශ්වයන් කවරේද;

(iv) එම එක් එක් පාර්ශ්වයන් වෙත බෙදීයන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2993/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොලිස් දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය කොස්තාපල් රියදුරන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාවෙන් දැනට රාජකාරී කරන සංඛ්‍යාව කොපමණද;

(iii) පොලිස් දෙපාර්තමේන්තුවේ පවතින පොලිස් කොස්තාපල් රියදුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පොලිස් කොස්තාපල් රියදුරු පුරප්පාඩු පැවතීම හේතුවෙන් පොලිස් ස්ථානවල විශාල වශයෙන් ගැටලු මතුවී තිබෙන බව දන්නේද;

(ii) මේ වන විට එම පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) පොලිස් කොස්තාපල් රියදුරන් බඳවා ගන්නා වයස් කාණ්ඩය කවරේද;

(iv) එම බඳවා ගැනීම සඳහා අවශ්‍ය අවම සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පොලිස් දෙපාර්තමේන්තුවේ කොස්තාපල් රියදුරු පුරප්පාඩුවලට අමතරව වෙනත් තනතුරුවල පුරප්පාඩු තිබේද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු තනතුරු කවරේද;

(iii) එම එක් එක් තනතුරෙහි පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1897/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, නාගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ උඩවැලිපිටිතලාව හන්දියේ සිට හොරන්ගල්ල දක්වා මාර්ගයේ අතුරන ලද කොන්ක්‍රීට් මේ වන විට කැඩී ගොස්, පාරේ වලවල් හැරී ඇති බවත්;

(ii) එම මාර්ගයේ කොන්ක්‍රීට් ඇතිරීම නිසි ප්‍රමිතියකින් තොරව සිදුකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කොන්ක්‍රීට් අතුරන ලද ඉහත මාර්ගයේ දිග සහ පළල කොපමණද;

(ii) කොන්ක්‍රීට් ඇතිරීම සඳහා වැයකරන ලද මුළු මුදල කොපමණද;

(iii) ඒ සඳහා අරමුදල් සපයන ලද ආයතනයේ හෝ ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම මාර්ගයේ කොන්ක්‍රීට් ඇතිරීම සිදු කළ කොන්ත්‍රාත්කරුගේ නම කවරේද;

(ii) කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවීමට පෙර කාර්මික නිලධාරී වාර්තාවක් ලබා ගෙන තිබේද;

(iii) එම මාර්ගයට කොන්ක්‍රීට් ඇතිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කරන්නේද;

(iv) කොන්ත්‍රාත්කරු මගින් හෝ වෙනත් ප්‍රතිපාදනයක් මගින් එම මාර්ගය නැවත ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, ඊට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2160/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කරන පශු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් සේවය කරන ස්ථාන කවරේද;

(iii) ඔවුන් අතරින් වනාන්තර කලාප සඳහා අනුයුක්ත කොට ඇති පශු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ට ලබා දී ඇති පහසුකම් කවරේද;

(v) වනජීවී කලාප සඳහා හිඟ හෝ අතිරික්ත පශු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(vi) පශු වෛද්‍යවරුන්ගේ පුරප්පාඩු පවතින්නේ නම්, එම පුරප්පාඩු සම්පූර්ණ කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2208/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයට අදාළව, පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) යෙදවූ මුළු ප්‍රාග්ධනය හා සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iii) කාර්ය මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව, එක් සේවකයකු වෙනුවෙන් දැරූ පිරිවැය සහ එක් සේවකයකුගෙන් ලැබූ ලාභය කවරේද;

(iv) රජය වෙත ගෙවන ලද අඩු කිරීම් හෝ බදු ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කවර හෝ මුදලක් කපාහරිනු ලැබුවේද;

(ii) එසේ නම්, එසේ කපා හරින ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එසේ කරන ලද්දේ කවර හේතුවක් නිසාද;

(iv) එය සිදු කළ දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ එම මුදල් භාවිතා කරන ලද ආකාරයට වඩා කාර්යක්ෂම ලෙස සංවර්ධන ලොතරැයි මණ්ඩලයට එම මුදල් පරිහරණය කළ හැකිව තිබුනේද;

(ii) එසේ නම්, එය කළ හැකි ආකාරය කවරේද;

(iii) එසේ කළ නොහැකි නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2328/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පොලිස් නිලධාරීන් සමග සමාන රාජකාරියේ යෙදෙන පොලිස් ආරක්ෂක සහායකයින්, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවයේ ස්ථිර කර විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) පොලිස් ආරක්ෂක සහායකයින්ගේ සේවය ස්ථිර කිරීම පොලිස් දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය යටතේ සිදු කරනු ලැබුවේද;

(ii) ඔවුන්ට නිසි නිල ඇඳුමක් සහ රාජකාරියේ යෙදෙන අවස්ථාවල තොරතුරු සටහන් පොතේ රාජකාරි වාර්තා කිරීමේ අවසරය ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) පොලිස් නිලධාරීන්ට හිමි වැටුප් වර්ධක, කලාප දීමනා, ගමන් වියදම්, දුෂ්කර දීමනා, බටා දීමනා සේවය ස්ථිර කළ දින සිටම පොලිස් ආරක්ෂක සහායකයන්ට ගෙවා තිබේද;

(iv) එසේ ගෙවා නොමැති නම්, එම වරප්‍රසාද ඔවුන්ට ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2545/'12

ගරු අනුර දිසානායක මහතා,— පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගයේ ගාල්ල සිට කොළඹ දක්වා කොටසේ මගී ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබා දී ඇති පෞද්ගලික බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍ර ලබා දී ඇති පදනම කවරේද;

(iii) එක් බලපත්‍රයක් ලබාගැනීමට වාර්ෂිකව ගෙවිය යුතු මුදල කොපමණද;

(iv) එම බස් ධාවනය සඳහා සකස්කර ඇති ධාවන කාලසටහන කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2953/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'මැනින් ටවුම' නිවාස යෝජනා ක්‍රමයේ ඇතැම් නිවැසියන් විසින් ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරට පටහැනිව අනවසර ඉදිකිරීම් සිදුකර ඇති බවත්;

(ii) එම නිවාස යෝජනා ක්‍රමයේ කළමනාකරණ සංස්ථාව විසින් එකී අනවසර ඉදිකිරීම් වාර්තා කිරීම හෝ ඉවත් කිරීම ඕනෑකමින්ම මග හැර ඇති බවත්;

(iii) සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය සිය බලතල අනුව අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා පරීක්ෂා නොකරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 'මැනින්ටවුම' නිවාස යෝජනා ක්‍රමයේ මේ වන විට ඇති අනවසර ඉදිකිරීම් වහාම ඉවත් කරන ලෙස සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට උපදෙස් දීමටත්;

(ii) එම අධිකාරියේ නිරන්තර පරීක්ෂා කිරීම් තුළින් ඉහත නිවාස සංකීර්ණයේ සහාධිපත්‍ය දේපල, පොදු අංගෝපාංග සහ පොදු දේපලවල පාලනය යථාපරිදි පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය නියෝග ලබා දීමටත්;

(iii) බද්ධ නිවාස අයිතිවාසිකම් පනතේ විධිවිධානවලට අනුකූලව හා යටත්ව කටයුතු කළයුතු බවට සියලු කළමනාකරණ සංස්ථාවලට පොදු උපදෙස් මාලාවක් නිකුත් කිරීමටත්;

කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2012 නොවැම්බර් මස 16 වැනි සිකුරාදා)

1631/'11

ගරු රාජීව විජේසිංහ මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (6)

(අ) ගෘහස්ත ප්‍රචණ්ඩත්වය වැළැක්වීම් පනත යටතේ,

(i) යම් කිසි ඉල්ලීමක් මත එම ඉල්ලීම පිළිබඳ විමර්ශනය අවසන් වන තෙක් අධිකරණය විසින් අතුරු ආරක්ෂණ නියෝගයක් නිකුත් කළ යුතු බවත්;

(ii) ඉල්ලීම ඉදිරිපත් කළ දින සිට දින 14ක් ඇතුළත එම ඉල්ලීම පිළිබඳ විමර්ශනයක් පැවැත්වීමට අධිකරණය විසින් නියෝගයක් නිකුත් කළ හැකි බවත්; සහ

(iii) අතුරු ආරක්ෂණ නියෝගයක් මාස 12 නොඉක්මවන කාල සීමාවක් සඳහා බල පැවැත්වෙන බවත්;

එතුමා දන්නෙහිද ?

(ආ) (i) එම නම් කරන ලද කාල සීමාවට පසු විමර්ශන නොපැවැත්වූ සහ විමර්ශන පැවැත්වූ නඩු කවරේද;

(ii) මෙම නීතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිවූ මහේස්ත්‍රාත්වරුන්ට මග පෙන්වීම සඳහා යොදා ගන්නා ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග සහ එම නිසා ප්‍රමාදයන්ට ලක්වූ වින්දිතයන්ට ගෙවීමට තිබෙන වන්දි ප්‍රමාණය කවරේද;

(iii) අතුරු නියෝග නොවන නියෝග සඳහා අවසන් දිනයක් තිබීමටත්, අතුරු නියෝග සඳහා එවන් දිනයක් නොතිබීමටත් හේතුව කවරේද;

(iv) එම විෂමතාව නිවැරදි කිරීම සඳහා පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2461/'12

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අඬ්ඩාලච්චේන 14, කොමන් පාරේ, අංක 4/5 දරන ස්ථානයේ පදිංචි එම්. ඒ. අබාජුල්ෆාන් මහතා ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපන සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට 2006.06.01 දින පෙනී සිට ඇති බවත්;

(ii) සියලු සුදුසුකම් සපුරා සිටියත් ඉහත තනතුරට පත්කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට මෙතෙක් ඔහුගේ නම නිර්දේශකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත කාරණයට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද (HRC/2775/09) නිර්දේශය ක්‍රියාවට නංවමින් (අංක 17/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව) ඔහුට හිමිවිය යුතු උසස්වීම ලබාදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යොමු කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2864/'12

ගරු එම්. ටී. හසන් අලි මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ මහ නගර සභාවේ විශ්‍රාමික සහකාර වැද්දුම්කරු ඒ. එච්. එම්. මහ්රූෆ් මහතාගේ පැමිණිල්ලකට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කොළඹ මහ නගර සභාවට නිකුත් කළ නිර්දේශයක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව පළාත් පාලන කොමසාරිස් (බ.ප.) විසින් අංක LGD/09/01/10 හා 2012.02.29 දිනැති ලිපිය මගින් නාගරික කොමසාරිස් වෙතින් විමසා ඇති බවත්;

(ii) 2012.05.14 දින සහ 2012.05.31 දිනැති ලිපි මගින් තවදුරටත් ඒ පිළිබඳව සිහි කැඳවීම් කොට තිබෙන බවත්;

(iii) රා. ප. චක්‍රලේඛ අංක 17/2005 ට පටහැනිව ක්‍රියා කරන කොළඹ මහ නගරසභාවේ නිලධාරීන් ඉහත අ(i) හි සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කිරීමට මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මහ්රූෆ් මහතාට නිර්දේශිත සහන ලබා දීම ප්‍රමාද කිරීමට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1632/'11

ගරු රාජීව විජේසිංහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (6)

(අ) (i) 2001 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී, 1841 අයාල ආඥාපනත යටතේ අත්අඩංගුවට ගත් සහ රක්ෂිත බන්ධනාගාරගත කළ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රක්ෂිත බන්ධනාගාරගත කොට සිටි අය අතුරින් තවමත් බන්ධනාගාරගතව සිටින හෝ වෙනත් ස්ථානවල රඳවා සිටින සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අයාල ආඥාපනතෙහි සඳහන් වන "නිවැරදි කළ නොහැකි නොදැමුණු පුද්ගලයන්" (Incorrigible Rogues) යන පදයෙහි අර්ථය කවරේද;

(ii) එම පදය භාවිතාකොට ඇත්තේ කවර අරමුණකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අයාල ආඥාපනතට සිදු කරන ලද වෙනස්කම් පිළිබඳව 2004 වසරේදී මානව හිමිකම් කොමිසම ඉදිරියේ නිර්දේශ ඉදිරිපත් කරන ලද බව පිළිබඳව සහ ඒවා භාවිතා කරන ආකාරය එතුමා දන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා පියවර ගනු ලැබුවේද;

(ii) නොඑසේ නම්, එම ආඥාපනත යටතේ වන ව්‍යවහාරයන් සඳහා වන වෙනස් කිරීම් තහවුරු කිරීමට ගනු ලබන අනෙකුත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2462/'12

ගරු මොහමඩ් අස්ලම් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අකුරණ, දොඩම්ගොල්ලේ, අංක 233/1 දරන ලිපිනයේ පදිංචි, කුරුගොඩ මුහන්දිරම්ලාගෙදර නූර් මුහම්මද් සෙයියද් මුහම්මද් මහතා විසින් නුවරඑළිය මහ නගර සභාව සතු "කාර්ගිල්ස් පිටිය" වෙළඳ සංකීර්ණයේ පිහිටි කඩ කාමරයක් බද්දට ලබා ගැනීම සඳහා වර්ෂ 1993.01.04 දින රුපියල් ලක්ෂයක මුදලක් සහ 2002.09.25 දින රුපියල් අනූදහසක මුදලක් තැන්පත් කරනු ලැබුවත් මෙතෙක් ඒ මහතාට කඩ කාමරය ලබාදී නොමැති බවත්;

(ii) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනයකට අනුව සෙයියද් මුහම්මද් මහතාට අදාළ කඩ කාමරය හිමිවිය යුතු බවට ලබා දුන් නිර්දේශය (HRC/K/429/06/11) එම පළාත් පාලන ආයතනය විසින් පැහැර හරිමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත නිර්දේශය ක්‍රියාවට නැංවීමෙන් වැළකී අංක 17/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය උල්ලංඝනය කරමින් සිටින නුවරඑළිය මහ නගර සභාවේ වගකිව යුත්තන්ට එරෙහිව අපක්ෂපාති පරීක්ෂණයක් පැවැත්වීමටත්, සෙයියද් මුහම්මද් මහතාට සාධාරණය ඉෂ්ට කිරීමටත් පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2865/'12

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හොරොව්පතාන පොලිස් ස්ථානයේ සේවය කරමින් සිටි උ.පො.කො. ඒ. එන්. එම්. තාහිර් මහතා (25878) අසනීප තත්ත්වය හේතුකොට ගෙන, පොලිස්පතිතුමාගේ අංක 190/2009 හා 2009.12.30 දිනැති චක්‍ර ලේඛය අනුව 2009.06.06 දින සිට විශ්‍රාම ගෙන සිටින බවත්;

(ii) 2006.02.24 දින සිට පොලිස් නිත්‍ය සේවයට පත්කොට තිබෙන මොහුගේ සේවය අන්තර්ග්‍රහණය කිරීමට අදාළ වන නිර්දේශය Staff/DIG/IG/ Out/259/11 හා 2011.10.04 දිනැති ලිපියක් මගින් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) තාහීර් මහතා පොලිස් නිත්‍ය සේවයට අන්තර්ග්‍රහණය කොට විශ්‍රාම දීමනා සහ අදාළ වැටුප් කඩිනමින් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2866/'12

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කහටගහමඩ, සියඹලාගස්කොටුවේ පදිංචි, එස්. එච්. එම්. පාතිමා මහත්මිය ගිරි/දලුපොතගම කණිෂ්ඨ විදුහලේ 2002.02.01 දින සිට ස්වේච්ඡා ගුරුවරියෙකු වශයෙන් සේවය කරමින් සිටින බවත්;

(ii) ඒ අනුව ගුරු සහායක පත්වීමක් ලැබීමට හිමිකම් ලද පාතිමා මහත්මියට වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා අධ්‍යාපන අමාත්‍ය ලේකම් විසින් ව/ප්‍රඅලේ/ආ13/3/4 හා 2009.08.17 දිනැති ලිපිය මගින් එම පත්වීම් ලිපි ප්‍රදානය කිරීමට යොමු අංක 11 යටතේ කැඳවීම් කරනු ලැබුවත්, එම ගුරු සහායක පත්වීම මෙතෙක් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වර්ෂ 2009 අගෝස්තු මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි පාතිමා මහත්මියට හිමි ගුරු සහායක පත්වීම ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2867/'12

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1996/09/27 දින හෝ ආසන්න දිනයක අම්පාර දිස්ත්‍රික්කයේ, පාන්ඩිරුප්පු පොලිස් මාර්ග බාධකයේ රාජකාරියේ යෙදී සිටියදී, ත්‍රස්තවාදීන් විසින් පැහැර ගෙන ගොස් වෙඩි තබා ඝාතනය කරනු ලැබූ කල්මුනේ පොලිසියට අනුයුක්ත ග්‍රාමාරක්ෂක භට, අබ්දුල් රමීස් මහතා (9913) වෙනුවෙන් වන්දි මුදල් සහ විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමක් මෙතෙක් සිදුවී නොමැති බවත්;

(ii) මේ පිළිබඳව කල්මුනේ පොලිසිය විසින්, අංක ඔඩබ්/3037/11 හා 2011.04.22 දිනැති ලිපිය මගින් සහ අම්පාර පොලිස් අධිකාරි විසින් අංක එස්ඒ2/ එච්ජී/10/2011 හා 2011.04.20 දිනැති ලිපිය මගින් ඉගිනියාගල සිවිල් ආරක්ෂක කාර්යාලය වෙත දැනුම් දී තිබුණත්, මේ දක්වාත් කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඝාතනයට ලක්වූ අවිවාහක අබ්දුල් රමීස් මහතාගේ වයෝවෘද්ධ දෙමව්පියන් වන එම්. ඒ. අබ්දුල් අසීස් සහ යූ.එල්. ආසියා උම්මා යන අයවලුන්ට එම වන්දි මුදල් සහ ඔහුගේ විශ්‍රාම වැටුප් නොපමාව ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2012 නොවැම්බර් මස 17 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1898/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කඩවාන වැව් බැම්ම කොටි ත්‍රස්තවාදීන් විසින් පුපුරවා හැර වර්ෂ විසි හයක් පමණ ගතවී ඇතත්, මේ දක්වා එය පිළිසකර නොකිරීම නිසා ගොවීන්ට වගා කටයුතු ආරම්භ කිරීමට නොහැකිවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීමට ඇති බාධාවන් කවරේද;

(ii) එම ගැටලු ඉවත්කර කඩිනමින් වැව අලුත්වැඩියා කිරීමට කටයුතු කරන්නේද;

(iii) ඒ සඳහා මේ වනවිට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2180/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010/2011 අයවැය මගින් යෝජිත සුළු හා මධ්‍ය පරිමාණ දේශීය ව්‍යවසායකයින් දිරිගැන්වීමේ ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුවෙන් මුදල් ලැබුනේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

(iii) එම මුදල් ලැබුනේ ණය මුදලක් වශයෙන්ද; නැතහොත් ආධාර වශයෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ව්‍යාපෘතිය යටතේ දේශීය ව්‍යවසායකයින් වෙත ණය ලබා දීමේදී,

(i) අයකළ පොලිය කොපමණද;

(ii) නිකුත් කළ උපරිම ණය මුදලේ වටිනාකම කොපමණද;

(iii) මැදිහත් වූ ආයතන කවරේද;

(iv) ප්‍රතිලාභ ලැබූ දිස්ත්‍රික්ක, පුද්ගලයන් හා ආයතන කවරේද;

(v) අදාළ කරගත් ව්‍යාපෘති කවරේද;

(vi) ප්‍රතිලාභ ලැබූ කෘෂි නිෂ්පාදන ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(vii) ණය මුදල් ආපසු ගෙවා නිම කිරීමට නියම කර ඇති වර්ෂ ගණන කොපමණද;

(viii) ණය ගෙවීම සඳහා ලබා දී ඇති සහන කාලය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2209/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අදාළව, පසුගිය වර්ෂ 5 තුළදී,

(i) යෙදවූ මුළු ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) කොටස් මුදල්වලින් ලැබුණ ලාභය සහ වත්කම්වලින් ලැබුණ ලාභය වෙන් වශයෙන් කොපමණද;

(iii) කාර්ය මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව සහ එක් සේවකයෙකුට යන වියදම කවරේද;

(iv) එක් සේවකයෙක් සඳහා දරන වියදම පෞද්ගලික අංශයේ බැංකු ආයතනයක් සමඟ සන්සන්දනාත්මකව කොපමණද;

(v) මේ වන විට නැවත දැරීමට සිදු නොවන වියදම් කවරේද;

(vi) බදු හෝ තීරුබදු ලෙස රජයට ගෙවූ මුදල් ප්‍රමාණය කොපමණද;

(vii) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2329/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, ඉකිරියගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වැකන්දවැව සද්ධාතිස්ස රජු දවසේ සිට මේ වන තෙක් තෝරපලා ඔයෙන් පෝෂණය වූ බවත්;

(ii) අඩි 50ක් උසැති, කිලෝ මීටර් 1ක් දිගැති වැව් බැම්මකින් සහ අක්කර 500 ක වපසරියකින් සමන්විත එම වැව තුළ අනවසරයෙන් අක්කර 25ක කුඹුරු යායක් පෝෂණය කිරීමට ඉඩදීම හේතුවෙන් ගොවි පවුල් 800කගේ ජීවිත අසරණභාවයට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පරිදි වැව තුළ ඇති අනවසර වගාකිරීම් ඉවත්කර වැකන්දවැව ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2528/'12

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2005 සිට 2010 දක්වා කාල සීමාව තුළ,

(i) නිල ඇඳුම් රෙදි ලබාගත් පාසල් සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) පාසල් නිල ඇඳුම් ලබාදීම සඳහා වෙන්කළ මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2005 සිට 2011 දක්වා කාල සීමාව තුළ,

(i) පාසල් නිල ඇඳුම් ලබාදීම සඳහා දේශීයව මිලදී ගත් මුළු රෙදි ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා ආනයනය කළ මුළු රෙදි ප්‍රමාණය කොපමණද;

යන්නත් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ආනයනය කළ පාසල් නිල ඇඳුම් රෙදිවල ප්‍රමිතිය හා ගුණාත්මකභාවය පරීක්ෂා කළ අය කවුරුන්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) මෙතෙක් අවසන්වී නොමැති 2012 වර්ෂය සඳහා පාසල් නිල ඇඳුම් ලබාදීමේ කටයුතු අවසන් කරන දිනය කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2782/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිවිධ හමුදාවන්හි සේවය කරන සෙබළුන්ට සහ නිලධාරීන්ට වර්ෂ 22ක සේවා කාලයකින් පසු විශ්‍රාම ලැබීමට හිමිකම තිබේද;

(ii) එකී සෙබළුන්ගේ සහ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප ගණනය කරනු ලබන පදනම කවරේද;

(iii) වසර 22 ක සේවා කාලය අවසානයේ විශ්‍රාම යන උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරීවලදී තුවාල ලබා ආබාධිතවූ සෙබළුන්ට සහ නිලධාරීන්ට ඔවුන්ගේ දුබලතාව සලකා විශේෂ දීමනාවක් විශ්‍රාම වැටුපට එකතු කරන්නේද;

(iv) එසේ නම්, ආබාධිත සෙබලුන්ට සහ නිලධාරීන්ට ලබාදෙන එම දීමනාව ගණනය කරනු ලැබූ ආකාරය කවරේද;

(v) ඉහත සඳහන් විශේෂ දීමනාව ලබා දීම මේ වන විට නතර කර තිබේද;

(vi) එසේ නම්, එයට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2994/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය සේවයේ මේ වනවිට පවතින මුළු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු සංඛ්‍යාව තනතුරු නාම අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෑතකදී සංවර්ධන සහකාර ලෙස බඳවාගත් දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර සිටින සමස්ත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) එසේ බඳවාගත් උපාධිධාරීන් සංඛ්‍යාව පළාත් අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3002/'12

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඇමරිකානු ඩොලර් මිලියන පන්සියයක් වූ ශ්‍රී ලංකා ප්‍රථම රාජ්‍ය බැඳුම්කරය සඳහා 2012 ඔක්තෝබර් මාසයේදී මුදල් ගෙවීමට නියමිතව තිබූ බව එතුමා දන්නෙහිද;

(ආ) (i) එම බැඳුම්කරය නිකුත් කළ නිශ්චිත දිනය, එහි පොළී අනුපාතිකය සහ එහි කල් පිරෙන දිනය කවරේද;

(ii) නිකුත් කළ දිනයේ එම බැඳුම්කරයෙන් ලද ආදායම ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණද;

(iii) එම බැඳුම්කරයෙන් ලද මුදල් භාවිතා කරනලද නිශ්චිත කාර්යයන් කවරේද;

(iv) ඉහත (iii) හි භාවිතයන් (ආයෝජනයන්) වෙතින් ලද, එම බැඳුම්කරය සඳහා මුදල් ආපසු ගෙවීමට යොදා ගතහැකි නිශ්චිත ආදායම් තිබේ නම්, ඒවා කවරේද;

(v) අදාළ බැඳුම්කරයේ මුල් මුදල සහ පොළිය ගෙවීමට නියමිත එක් එක් දිනයේදී හා කල් පිරීමේදී ගෙවනු ලබන පොළියද ඇතුළුව ආපසු ගෙවනු ලබන මුළු මුදල ඇමරිකානු ඩොලර්වලින් සහ ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණද;

(vi) පොළී සංරචකය සහ මුදල් ඒකකය අවප්‍රමාණවීම නිසා ගෙවීමට සිදුවන යම් අතිරේක මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1899/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්ව තිබූ, ඉඹුල්පිටිය, ගා/ රාමදොල කණිෂ්ඨ විද්‍යාලයය මීට වර්ෂ කිහිපයකට පෙර වැසීයාම නිසා ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සම්පත් විනාශවෙමින් පවතින බවත්;

(ii) මේ වනවිට එම පාසල් භූමිය අසල්වාසීන් විසින් අත්පත්කර ගැනීමේ අවදානමක් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බලහත්කාරයෙන් පාසල් භූමිය අත්පත් කරගැනීම නවතාලීමට කටයුතු කරන්නේද;

(ii) ගා/ රාමදොල කණිෂ්ඨ විද්‍යාලයය සතු භූමිය සහ ගොඩනැගිලි වෙනත් ඵලදායී කටයුත්තක් සඳහා යොදා ගැනීමට සැලසුම්කර තිබේද;

(iii) එසේ නම්, එම සැලසුම කුමක්ද;

(iv) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2239/'12

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීම යෝජනා වූ දිනය කවරේද;

(ii) ඉහත කී අධිවේගී මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් මුලදී ඇස්තමේන්තු කළ මුදල කොපමණද;

(iii) මෙම දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා මේ දක්වා වැය වී ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගයේ දුර ප්‍රමාණය කිලෝමීටර් කොපමණද;

(ii) දක්ෂිණ අධිවේගී මාර්ගය ගාල්ල සිට මාතර දක්වා දීර්ඝ කිරීමට නියමිතව තිබේද;

(iii) අධිවේගී මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වූ ප්‍රවේශ ස්ථානවලින් අධිවේගී මාර්ගය භාවිතා කිරීම සඳහා අයකළ ගාස්තු මගින් මේ දක්වා එකතු වූ මුළු මුදල කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2263/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නියෝජ්‍ය අමාත්‍යවරයෙකුගේ ආරක්‍ෂාව සඳහා ලබා දී ඇති ආරක්‍ෂක නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආරක්‍ෂක නිලධාරීන් පොලිස් නිලධාරීන් ද, ඇමති ආරක්‍ෂක අංශයේ නිලධාරීන්ද, නැතහොත් හමුදා නිලධාරීන් ද;

(iii) උක්ත නිලධාරීන්ට අමතරව වෙනත් පුද්ගලයින් නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ ආරක්‍ෂාව සඳහා යොදවා තිබේද;

(iv) එසේ නම්, ඔවුන් කවුරුන්ද;

(v) ආරක්ෂාව සඳහා එම පුද්ගලයින් යොදවා ගෙන ඇති නියෝජ්‍ය අමාත්‍යවරු කවුරුන්ද;

(vi) නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් එවැනි පිරිසක් යොදා ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත අ (i) හි සඳහන් නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට ලබා දී ඇති පසුපෙළ රථ (Backup Vehicles) සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2330/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පොලිස් සේවාවට සහායවීම සඳහා 2006.08.02 දින අංක 16/1395/206/052 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ස්ථාපනය කර ඇති බවත්;

(ii) යුදමය වාතාවරණයක් පැවති අවස්ථාවේදී, ජාතික වැදගත්කමක් ඇති උත්සවවලදී සහ විවිධ ආපදා අවස්ථාවන්හිදී සිවිල් ආරක්ෂක නිලධාරීන් පූර්ණ කැපවීමෙන් කටයුතු කර ඇති බවත්;

(iii) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2009.12.15 වැනි දින නිකුත් කළ චක්‍රලේඛයෙහි 2009.10.31 වැනි දිනට අඛණ්ඩව දින 180ක් සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන්ගේ සේවය කඩිනමින් ස්ථිර කරන බවට සඳහන් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැනට සිවිල් ආරක්ෂක සේවයේ නියුතු කාර්ය මණ්ඩලය කොපමණද;

(ii) එම සේවයේ විවිධ ක්ෂේත්‍රවල සේවය කරන එක් එක් නිලධාරීන්ට දැනට ගෙවනු ලබන දෛනික වැටුප කොපමණද;

(iii) දෛනික වැටුපට සේවය කරන ඉහත දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ සේවය ස්ථිර කර, ස්ථිර වැටුප් තලයක පිහිටුවා රජයේ නිලධාරීන්ට හිමි සියලුම වරප්‍රසාද ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) ඒ සඳහා ගතවන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2535/'12

ගරු අනුර දිසානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 වර්ෂයේදී,

(i) ශිෂ්‍යාධාර ලබාගෙන ඇති විශ්වවිද්‍යාල සිසුන් සංඛ්‍යාව එක් එක් විශ්වවිද්‍යාලය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විශ්වවිද්‍යාල සිසුන්ට ශිෂ්‍යාධාර ලබාදීමට වැය කර ඇති මුළු මුදල කොපමණද;

(iii) ශිෂ්‍යාධාර ගෙවීම වෙනුවෙන් එක් එක් විශ්වවිද්‍යාලය සඳහා වෙන් කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විශ්වවිද්‍යාල සිසුන්ගේ ශිෂ්‍යාධාර වාරිකය අවසන්වරට වැඩි කළ වර්ෂය කවරේද;

(ii) එම අවස්ථාවේදී වාරිකය වැඩි කළ මුදල කොපමණද;

(iii) දැනට ශිෂ්‍යාධාර වාරිකය ලෙස ලබාදෙන මුදල කොපමණද;

(iv) එම වාරික මුදල වැඩිකිරීමට පියවර ගනු ලබන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2995/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 ජූනි මස වාර්තා වූ බාල පෙට්‍රල් අර්බුදයට අමතරව 2012 ජූලි 23 වැනි දින බාල තත්ත්වයේ ඩීසල් පිළිබඳ අර්බුදයක්ද වාර්තා වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වාර්තා අනුව තත්ත්වයෙන් බාල ඩීසල් සපයා ඇති සමාගම කවරේද;

(ii) ප්‍රමිතියෙන් තොර තෙල් ලබාදීම පිළිබඳව එම සමාගමට විරුද්ධව මීට පෙර චෝදනා එල්ල වී තිබේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙරටට ආනයනය කිරීමේ දී ඉන්ධනවල ප්‍රමිතිය පිළිබඳ සහතික කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) තෙල් ආනයනය කිරීමට ටෙන්ඩර් කැඳවීමේ බලය හිමි ආයතනය කවරේද;

(iii) ටෙන්ඩර් කමිටුව පත්කරනු ලබන බලධාරියා කවුරුන්ද;

(iv) තත්ත්වයෙන් බාල ඩීසල් ආනයනය කිරීමට මැදිහත්වූ ටෙන්ඩර් කමිටුවේ සාමාජිකයන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) දැනට ලංකාවට තෙල් ආනයනය කිරීමට ලියාපදිංචි වී ඇති සමාගම් කවරේද;

(ii) ඒ අතරින් මේ වන විට ක්‍රියාකාරී නොවන සමාගම් කවරේද;

(iii) දැනට අසාදු ලේඛන ගතකළ සමාගම් කවරේද;

(iv) ලෝ සල්ෆර් (Low Sulphar) ඉන්ධන සපයන සමාගම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

3003/'12

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම්ව, ජීවන වියදම් දීමනාව ගණනය කරනුයේ කෙසේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ජීවන වියදම් දීමනාව ගණනය කිරීමෙහිලා භාවිතා කළ කොළඹ පාරිභෝගික මිල දර්ශක ශ්‍රේණිය, මෑත කාලයකදී වෙනස් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එවැනි වෙනසක් සිදු කළ දිනය කවරේද;

(iii) එම වෙනස් කිරීමට පෙර සහ පසුව, එම මිල දර්ශකයේ සෑම ඒකකයකම වටිනාකම රුපියල්වලින්, වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත සඳහන් කර ඇති ඒකකයක වටිනාකම රුපියල්වලින් සැලකීමේදී වෙනසක් තිබේනම්, නව වටිනාකම සාධාරණීකරණය කරනුයේ කෙසේද;

(v) අලුතෙන් කොළඹ පාරිභෝගික මිල දර්ශකයක් භාවිතා කළ යුතුද; නැතහොත්, එම දර්ශකයේ සෑම ඒකකයක් සඳහාම රුපියල්වලින් ගණනය කරන ලද සංශෝධිත ඒකක වටිනාකමක් භාවිතා කළ යුතුද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 නොවැම්බර් මස 19 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1881/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගිරිබාව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි ගිරිබාව ශ්‍රවණාගාරය ප්‍රයෝජනයට නොගෙන විනාශවීමට ඉඩහැර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) ඒ සඳහා අරමුදල් සපයන ලද ආයතනය කුමක්ද;

(iii) එම ගොඩනැගිල්ල මෙලෙස විනාශවීමට ඉඩහැර තිබීමට හේතු කවරේද;

(iv) ශ්‍රවණාගාරය භාවිතය සඳහා පවතින බාධාවන් ඉවත්කර මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමට සැලසුම්කර තිබේද;

(v) එසේ නම්, ඊට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2241/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010 සහ 2011 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන්,

(i) රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින්, එම අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට ලබාගැනීම සඳහා දරන ලද මුළු වියදම කොපමණද;

(ii) එම එක් එක් ගොඩනැගිල්ලෙහි වර්ග අඩියක් සඳහා කුලිය සහ බදු හෝ කුලී කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අමාත්‍යාංශයට අයත් නොවන ආයතනවලින් කුලියට හෝ බද්දට වාහන ලබා ගැනීම සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(iv) කුලියට හෝ බද්දට ලබාගත් මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(v) අමාත්‍යාංශය විසින් බාහිරින් ලබාගත් අනෙකුත් සේවාවන් කවරේද;

(vi) එකී බාහිරින් ලබාගත් සේවාවන් සඳහා දරන ලද වියදම කොපමණද;

(vii) අමාත්‍යාංශයේ මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(viii) බාහිරින් සේවා ලබා ගැනීමේ පදනම මත ගිවිසුම්වලට එළැඹ සේවය සපයන සේවකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2264/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැබිනට් අමාත්‍යවරයෙකුගේ ආරක්‍ෂාව සඳහා ලබා දී ඇති ආරක්‍ෂක නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආරක්‍ෂක නිලධාරීන් පොලිස් නිලධාරීන් ද, ඇමති ආරක්‍ෂක අංශයේ නිලධාරීන් ද, නැතහොත් හමුදා නිලධාරීන් ද;

(iii) උක්ත නිලධාරින්ට අමතරව වෙනත් පුද්ගලයින් අමාත්‍යවරුන්ගේ ආරක්‍ෂාව සඳහා යොදවා තිබේද;

(iv) එසේ නම්, ඔවුන් කවුරුන්ද;

(v) ආරක්ෂාව සඳහා එම පුද්ගලයින් යොදවා ගෙන ඇති අමාත්‍යවරු කවුරුන්ද;

(vi) අමාත්‍යවරුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් එවැනි පිරිසක් යොදා ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත අ(i) හි සඳහන් අමාත්‍යවරයෙකුට ලබා දී ඇති පසුපෙළ රථ (Backup Vehicles) සංඛ්‍යාව කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2331/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මධ්‍යම රජයේ හා පළාත් සභා යටතේ පාලනයවන පාසල්වල බුද්ධ ධර්මය විෂයය ඉගැන්වීම සඳහා අවශ්‍ය ගුරුවරු සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) බුද්ධ ධර්මය විෂයය ඉගැන්වීමට බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත් අය ගුරු සේවයට බඳවා ගැනීමට අදාළව අංක අමප/10/2376/436/052 යටතේ 2010 ඔක්තෝබර් 28 දින කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබේද;

(ii) දැනට බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත්ව ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ ගුරුභවතුන් බඳවා ගන්නා ක්‍රියාපටිපාටියට අනුකූලව බුද්ධ ධර්මය විෂයය ඉගැන්වීම සඳහා බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත් අය බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම බඳවා ගැනීම් කොපමණ කාලයක් තුළ සිදු කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 නොවැම්බර් මස 20 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2057/'11

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) පසුගිය වර්ෂ දෙක තුළදී සේවක අර්ථසාධක අරමුදල විසින් කොළඹ කොටස් වෙළඳපලේ සිදුකරන ලද සියලුම ලැයිස්තුගත කොටස් මිලදීගැනීම් හා විකිණීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් එක් ගනුදෙනුව සඳහා වගකීම දැරූ තැරැව්කරුවන්ගේ නම් කවරේද;

(iii) තැරැව්කාර ගාස්තු ද ඇතුළුව එක් එක් ගනුදෙනුවට අදාළ පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් වර්ෂ දෙකක කාල පරිච්ඡේදය සඳහා එක් එක් කොටස් තැරැව්කාර සමාගමට ගෙවන ලද තැරැව්කාර ගාස්තු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එක් එක් මිලදී ගැනීමට හෝ විකිණීමට සති දෙකකට පෙර සහ මිලදී ගැනීමෙන් හෝ විකිණීමෙන් සති දෙකකට පසු ඉහත (අ) (i) හි සඳහන් එක් එක් කොටසෙහි ඇවුරුම් මිල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2242/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට ලබාගැනීම සඳහා දරන ලද මුළු පිරිවැය කොපමණද;

(ii) එක් එක් ගොඩනැගිල්ලේ වර්ග අඩියක් සඳහා කුලිය සහ කුලී හෝ බදු කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අමාත්‍යාංශයට අයත් නොවන ආයතනවලින් කුලියට හෝ බද්දට වාහන ලබා ගැනීම සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(iv) කුලියට හෝ බද්දට ලබාගත් මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(v) අමාත්‍යාංශය විසින් බාහිරින් ලබාගත් අනෙකුත් සේවාවන් කවරේද;

(vi) ඉහත සඳහන් බාහිරින් ලබාගත් සේවාවන් වෙනුවෙන් දරන ලද පිරිවැය කොපමණද;

(vii) අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාව කොපමණද;

(viii) බාහිරින් සේවා ලබාගැනීමේ පදනම යටතේ ගිවිසුම්වලට එළැඹ සේවය සපයන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න 2012 වර්ෂය සඳහා එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2265/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරන අධීක්ෂණ මන්ත්‍රීවරයෙකුගේ ආරක්‍ෂාව සඳහා ලබා දී ඇති ආරක්‍ෂක නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආරක්‍ෂක නිලධාරීන් පොලිස් නිලධාරීන් ද, ඇමති ආරක්‍ෂක අංශයේ නිලධාරීන්ද, නැතහොත් හමුදා නිලධාරීන්ද;

(iii) උක්ත නිලධාරින්ට අමතරව වෙනත් පුද්ගලයින් අධීක්ෂණ මන්ත්‍රීවරුන්ගේ ආරක්‍ෂාව සඳහා යොදවා තිබේද;

(iv) එසේ නම්, ඔවුන් කවුරුන්ද;

(v) ආරක්ෂාව සඳහා එම පුද්ගලයින් යොදවා ගෙන ඇති අධීක්ෂණ මන්ත්‍රීවරු කවුරුන්ද;

(vi) අධීක්ෂණ මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් එවැනි පිරිසක් යොදා ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත අ(i) හි සඳහන් අධීක්ෂණ මන්ත්‍රීවරයෙකුට ලබා දී ඇති පසුපෙළ රථ (Backup Vehicles) සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2332/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත්, කිරින්ද ග්‍රාම නිලධාරී වසමේ සිට රන්මිණිතැන්න දක්වා ප්‍රදේශයේ වර්ෂ 25කට වැඩි කාලයක් හේන් වගාව කරමින් ජීවිකාව ගෙන යන ගොවි පවුල් 5000ක් පමණ සිටින බවත්;

(ii) 2007 වර්ෂයේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉඩම් සංගණනයක් යැයි පවසමින් එම ගොවි බිම් මැන මායිම් ගල් දමා ඇති බවත්;

(iii) එසේ මැනුම් කරනු ලැබූ ගොවි බිම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියක් ආරම්භ කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ගොවි බිම් අත්පත් කරගැනීම නවතාලීමට කටයුතු කරන්නේද;

(ii) ගොවි බිම් අත්පත් කර ගැනීම නිසා ඉඩම් අහිමි වූ ගොවීන් සඳහා තම ජීවිකාව ගෙනයාමට හැකිවන පරිදි එම ප්‍රදේශයෙන් අක්කරයක ඉඩම් කොටසක් ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) මෙම කාර්යය කොපමණ කාලයක් තුළ නිම කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2012 නොවැම්බර් මස 21 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1939/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මාබොටුවන ප්‍රජා ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා දක්ෂිණ සංවර්ධන අධිකාරිය මගින් වැය කරන ලද මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ප්‍රජා ශාලාව මේ වන විට ගොඩනැගිල්ලකට හා නාම පුවරුවකට පමණක් සීමා වී ඇති බවත්;

(ii) මුදල් වැයකර ප්‍රතිසංස්කරණය කළ එම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට නොගෙන අත්හැර දමා තිබීම ජාතික අපරාධයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, පවත්නා අඩුපාඩු කඩිනමින් සම්පූර්ණ කර මහජනතාවගේ භාවිතය සඳහා එම ප්‍රජා ශාලාව විවෘත කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2243/'12

ගරු රවි කරුණානායක මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට ලබාගැනීම සඳහා දරන ලද මුළු පිරිවැය කවරේද;

(ii) එක් එක් ගොඩනැගිල්ලේ, වර්ග අඩියක් සඳහා කුලිය සහ කුලී හෝ බදු කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අමාත්‍යාංශයට අයත් නොවන ආයතනවලින් කුලියට හෝ බද්දට වාහන ලබාගැනීම සඳහා වැයකළ මුළු මුදල කොපමණද;

(iv) කුලියට හෝ බද්දට ලබාගත් මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(v) අමාත්‍යාංශය විසින් බාහිරින් ලබාගත් අනෙකුත් සේවාවන් කවරේද;

(vi) ඉහත සඳහන් බාහිරින් ලබාගත් සේවාවන් වෙනුවෙන් දරන ලද පිරිවැය කොපමණද;

(vii) අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාව කොපමණද;

(viii) බාහිරින් සේවා ලබා ගැනීමේ පදනම යටතේ ගිවිසුම්වලට එළැඹ සේවය සපයන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න 2012 වර්ෂය සඳහා එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2272/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත්, කොළඹ, මාලිගාවත්ත ජාතික නිවාස යෝජනා ක්‍රමයේ ඊ 2/2/2 දරන නිවාස ඒකකයේ හිමිකරුගේ නම කවරේද;

(ii) එම නිවාස ඒකකය භාවිත කරන්නන් විසින් සැලැස්මට අනුකූල නොවන ලෙස එම නිවාස ඒකකය වෙනස් කිරීමකට භාජනය කිරීමක් හෝ පුළුල් කිරීමක් හෝ සිදුකර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා අනුමතිය ලබාගෙන තිබේද;

(iv) අනුමතිය ලබා දී තිබේ නම්, එම ලේඛන ඉදිරිපත් කරන්නේද;

(v) එම වෙනස් කිරීම් සිදු කිරීම සඳහා අනුමතිය ලබා දුන් බලධාරියා කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත නිවාස ඒකකයේ සිදු කර ඇති වෙනස් කිරීම් ඉවත් කරන්නේද;

(ii) එසේ නම්, ඉවත් කරන දිනය කවරේද;

(iii) එම වෙනස් කිරීම් ඉවත් නොකරන්නේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2333/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004 හා 2006 වර්ෂවලදී රාජ්‍ය සේවකයින්ට ලබාදුන් වැටුප් පරිවර්තනයන්ට සමගාමීව 2006.01.01 දිනට පෙර විශ්‍රාම ගිය රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීමටත් ;

(ii) වැටුප් විෂමතාවයන් ඉවත් කිරීම සලකා බැලීම සඳහා අවස්ථා කිහිපයකදී පත්කරන ලද කමිටු වාර්තාවල සඳහන් නිර්දේශ සලකා එම විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමේදී දීමනා ලබාදීම වෙනුවට වැඩිවන අගයන් ඒකාබද්ධ වැටුපට එකතු කිරීමටත්;

එතුමා කටයුතු කරන්නෙහිද?

(ආ) (i) 2004 හා 2006 යන වර්ෂවලදී විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුපට 2012 අයවැය ලේඛනයෙන් ප්‍රමාණවත් දීමනාවක් එක් කර තිබේද;

(ii) රාජ්‍ය සේවකයින්ට යම්කිසි වැටුප් පරිවර්තනයක් සිදුකරන්නේ නම්, එයට සමගාමීව සියලුම විශ්‍රාමිකයින්ට එම වැඩිවීම ලබාදීමේ ජාතික ප්‍රතිපත්තියක් පාර්ලිමේන්තු පනතකින් සම්මත කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 නොවැම්බර් මස 22 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1940/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ භාණ්ඩ ගබඩා කිරීමට වෙන්කර තිබූ ගුදම් අංක 04 මන්නාරමේ තෙල් කැණීමේ නිරත ඉන්දියානු සමාගමකට ලබාදී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගුදම ඉන්දියානු සමාගමට ලබාදීමට හේතු කවරේද;

(ii) එය ලබා දී ඇති පදනම කවරේද;

(iii) එම ගුදම ඉන්දියානු සමාගමකට ලබාදීමෙන් අපේක්ෂිත ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2244/'12

ගරු රවි කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට ලබාගැනීම සඳහා දරන ලද මුළු පිරිවැය කොපමණද;

(ii) එම එක් එක් ගොඩනැගිල්ලේ වර්ග අඩියක් සඳහා කුලිය සහ කුලී හෝ බදු කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අමාත්‍යාංශයට අයත් නොවන අයතනවලින් කුලියට හෝ බද්දට වාහන ලබා ගැනීම සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(iv) කුලියට හෝ බද්දට ලබාගත් මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(v) අමාත්‍යාංශය විසින් බාහිරින් ලබාගත් අනෙකුත් සේවාවන් කවරේද;

(vi) ඉහත සඳහන් බාහිරින් ලබාගත් සේවාවන් වෙනුවෙන් දරන ලද පිරිවැය කොපමණද;

(vii) අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාව කවරේද;

(viii) බාහිරින් සේවා ලබාගැනීමේ පදනම යටතේ ගිවිසුම්වලට එළඹ සේවය සපයන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න 2012 වර්ෂය සඳහා එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2273/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂය සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය පවත්වන ලද දිනය කවරේද;

(ii) එකී විභාගයේ ප්‍රතිඵල නිකුත් කරන ලද දිනය කවරේද;

(iii) නිකුත් කරන ලද ප්‍රතිඵල අවලංගු කර නැවත ප්‍රතිඵල නිකුත් කිරීමක් සිදු කළේද;

(iv) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීමේදී ඇතිවූ අවුල් සහගත තත්ත්වය පිළිබඳ වගකිවයුත්තෝ කවුරුන්ද;

(ii) ඔවුන් සම්බන්ධයෙන් ගැනීමට නියමිත හෝ ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ප්‍රතිඵල සංශෝධනය හේතුවෙන් බලාපොරොත්තු කඩවී අපහසුතාවයට පත්වූ පාර්ශ්වයන් සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

(iv) ඉදිරියේදී විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් අවුල් සහගත තත්ත්වයන් ඇති නොවීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2334/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාව යටතේ සම්ප්‍රදායික දේශීය වෛද්‍යවරුන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීමට යෝජනා කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට එම විශ්‍රාම වැටුප් වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 නොවැම්බර් මස 23 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1941/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රදේශයේ පිහිටි, අලපලාදෙණිය ප්‍රාදේශීය තේ ව්‍යාප්ති මධ්‍යස්ථානයට අයත් ගොඩනැගිලි සහ තේ වගා කරන ලද භූමිය භාවිතයට නොගෙන අත්හැර දැමීම හේතුවෙන් වල්බිහි වෙමින් පවතින බවත්;

(ii) මෙම මධ්‍යස්ථානය ප්‍රයෝජනයට නොගෙන අත්හැර දමා තිබීම ජාතික අපරාධයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අලපලාදෙණිය ප්‍රාදේශීය තේ ව්‍යාප්ති මධ්‍යස්ථානය අතහැර දැමීමට හේතු කවරේද;

(ii) එම මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කර ඒ තුළින් ප්‍රදේශයේ තේ වගාකරුවන්ගේ ක්ෂේත්‍ර ගැටලු සඳහා උපදෙස් සලසාදීමට කටයුතු කරන්නේද;

(iii) ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2245/'12

ගරු රවී කරුණානායක මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ඇති ලෝක උරුම ස්ථානයන් කවරේද;

(ii) එවැනි දර්ශනීය ස්ථානයන් මනා තත්ත්වයෙන් පවත්වාගෙන යාම සහ නඩත්තු කිරීම වෙනුවෙන් වැය කරන ලද මුදල් ප්‍රමාණය කවරේද;

(iii) පසුගිය වර්ෂ තුනක කාලය තුළ, දේශීය ලෝක උරුම ස්ථානයන් නැරඹීම සඳහා පැමිණි පුද්ගලයන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පසුගිය වර්ෂ තුනක කාලය තුළ, එම ස්ථානවලින් උපයා ගන්නා ලද ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2010 සහ 2011 වර්ෂයන්වලදී ඉහත කී ස්ථානයන්හි සෘජු හා වක්‍ර ලෙස සේවයේ යෙදී සිටි පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2274/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඩෙව්කොෂෝවා සමාගම ලෙසින් ආරම්භකරන ලද පසුව ෆුජිමා ස්ටේට් කෝපරේෂන් සමාගම නමින් පවත්වාගෙන යන ආයතනය සතු කොටදණියාව වැඩබිම මේ වන විට ක්‍රියාත්මක වන්නේද;

(ii) එහි සේවය කරන සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ දක්වා ඔවුන්ගේ වේතන ගෙවා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත නම සඳහන් ආයතනය සතු යන්ත්‍ර සූත්‍ර සහ වාහන කවරේද;

(ii) එකී යන්ත්‍රවල සහ වාහනවල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වැඩපල පිහිටි ස්ථානයෙන් ඉවත් කිරීමට හෝ යන්ත්‍ර සූත්‍ර ගලවා වෙන්දේසි කිරීමට හෝ විකුණා දැමීමට හෝ කටයුතු යොදා තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ආරම්භ කළ වර්ෂයේ සිට මේ දක්වා එම වැඩබිම ලැබූ ලාභය හෝ පාඩුව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම වැඩබිම රජයේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කවදා සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2335/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාව යටතේ හෙද සේවය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා පොරොන්දුවක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මේ වනවිට එම ජාතික ප්‍රතිපත්තිය සකස් කර අවසන්ව තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 නොවැම්බර් මස 24 වැනි සෙනසුරාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1942/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඇඹිලිපිටිය කඩදාසි කම්හල සහ කන්තලේ පිහිටා ඇති සීනි කර්මාන්තශාලාව විදේශීය සමාගම් කිහිපයකට විකුණාදැමීමේ සැලසුමක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම ආයතන දෙක විකිණීමට අපේක්‍ෂා කරන සමාගම්වල නම් සහ එම සමාගම් අයත් රටවල්වල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ආයතන අලෙවිකිරීමේ දී මිල ගණන් කැඳවීමක් සිදුකරනු ලැබුවේද;

(iii) එසේ නම්, ඒ සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන ලද සමාගම් සහ ඒවා අයත් රටවල නම් කවරේද;

(iv) එම එක් එක් ආයතනය ඉදිරිපත් කරන ලද මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම ආයතන විකිණීම මගින් රජය අපේක්‍ෂා කරන මුළු ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත ආයතන විකිණීම, රාජ්‍ය ආයතන විකුණා නොදමන බවට මහින්ද චින්තනයේ සඳහන් ප්‍රකාශයට පටහැනි බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2275/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වනජීවී සංරක්‍ෂණ දෙපාර්තමේන්තුවට අයත් ජාතික උද්‍යානවල සේවය කරන ස්වේච්ඡා මාර්ගෝපදේශකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට පවරා ඇති වගකීම් කවරේද;

(iii) ඔවුන්ගේ මාසික හෝ දෛනික වේතනය හෝ දීමනාව කොපමණද;

(iv) වන සතුන් හා සම්බන්ධ ක්ෂේත්‍රයක සේවය කරන එම පිරිසට සේවා කාලයේදී සිදුවන ආපදාවලදී ගෙවනු ලබන දීමනා හෝ ලබාදෙන වරප්‍රසාද කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ස්වේච්ඡා සේවකයින් ලෙස බඳවාගෙන මේ වනවිට ස්ථිරකර ඇති මාර්ගෝපදේශකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ස්ථිර නොකරන ලද මාර්ගෝපදේශකයින්ගේ සේවය ස්ථිර කරන්නේද;

(iii) එම මාර්ගෝපදේශකයින්ගේ වේතනය හෝ දීමනාව වැඩි කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2313/'12

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගයෙන් ලැබෙන මාසික ආදායම කොපමණද;

(ii) එක් මාසයක කාලය තුළ දක්ෂිණ අධිවේගී මාර්ගයේ ගමන් කරන වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (අ)(ii) හි සඳහන් වාහන සංඛ්‍යාව, දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීම පිළිබඳ අදහස ඉදිරිපත් කෙරුණු අවස්ථාවේදී අපේක්ෂා කරන ලද වාහන සංඛ්‍යාවට සමානවේද;

(iv) නොඑසේ නම්, ව්‍යාපෘතිය ආරම්භයේදී මෙම මාර්ගය භාවිතා කරනු ඇති බවට අපේක්ෂිත වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එමෙන්ම,

(i) දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා ලබාගෙන ඇති ණය මුදල් ආපසු ගෙවීමට ලබා දී ඇති කාලය කොපමණද;

(ii) ණය මුදල් සැපයූ ආයතනයන්ට වාර්ෂිකව ගෙවිය යුතු මුළු මුදල (මුල් ණය මුදල + පොළිය) කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2336/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාව යටතේ පිළිකා වැනි බෝනොවන රෝග මුළුමනින්ම පාලනය කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීමට හා ඊට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කිරීමට ස්වාධීන විද්වතුන්ගෙන් සමන්විත කාර්ය සාධක බලකායක් පත්කිරීමටත්, මාස හයක් තුළ අදාළ කටයුත්ත නිම කිරීමටත් පොරොන්දුවක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම කාර්ය සාධක බලකායට ඇතුළත් වූ විද්වතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එමගින් ඉදිරිපත් කරන ලද නිර්දේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 නොවැම්බර් මස 26 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1943/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කලුතර දිස්ත්‍රික්කයේ, බණ්ඩාරගම, මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දැල්කඩ, අම්බිලකන්ද නමැති, රජයට අයත් ඉඩමේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන ගිය යන්ත්‍රානුසාරයෙන් කලුගල් කැඩීමේ මධ්‍යස්ථානය ආරම්භ කිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) ඒ සඳහා අරමුදල් සපයා ගනු ලැබූ මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආරම්භ කර වර්ෂයක් ගතවීමටත් පෙර එම කලුගල් කැඩීමේ මධ්‍යස්ථානය වසා දමා ඇති බවත්;

(ii) එම මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ නියමිත ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව, පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමතියෙන් තොරව මිලදී ගෙන ඇති බවත්;

(iii) එම මධ්‍යස්ථානයේ කටයුතු නියමිත ක්‍රමවේදයෙන් බැහැරව, අත්තනෝමතික ලෙස සිදු කිරීම නිසා ප්‍රදේශයේ ජනතාව සතු විශාල මුදලක් නාස්ති වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම්, ඒ පිළිබඳව විධිමත් පරීක්‍ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2276/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්වවිද්‍යාලවල ආරක්‍ෂක කටයුතු රක්නා ආරක්‍ෂණ ලංකා සමාගමට පැවරීමට පෙර එම ආරක්‍ෂක කටයුතු භාරව කටයුතු කළ ආරක්ෂක නිලධාරීන් සේවයේ යොදවා තිබුණේ ගිවිසුම්ගත කාල සීමාවකට නම්, එම සේවා කාලය අවසන් කළ යුතුව තිබූ දිනය කවරේද;

(ii) එකී දිනයට පෙර ඔවුන් ඉවත් කළේ නම්, එසේ කිරීමට හේතු කවරේද;

(iii) ගිවිසුම්ගත කාල සීමාවට පෙර තම රැකියා අහිමිව මහත් දුෂ්කරතාවයට පත්ව ඇති ඉහත සඳහන් ආරක්‍ෂක නිලධාරීන්ගේ පවුල්වලට සහනයක් සැලසීම සම්බන්ධයෙන් රජය ගන්නා ක්‍රිය මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2314/'12

ගරු රවී කරුණානායක මහතා,— කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වනවිට,

(i) මෙරට සේවකයන් විසින් හිමිකාරිත්වය දරනු ලබන සේවක අර්ථසාධක අරමුදලේ (EPF) මුළු වටිනාකම කොපමණද;

(ii) සේවක අර්ථසාධක අරමුදල විසින් මුදල් ආයෝජනය කර ඇති ආයතනවල නම් කවරේද;

(iii) සේවක අර්ථසාධක අරමුදලේ සාමාජික සංඛ්‍යාව කොපමණද;

(iv) සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් නොගෙවන සාමාජික සංඛ්‍යාව කොපමණද;

(v) එසේ දායක මුදල් නොගෙවන සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකයින්ගෙන් මුදල් එකතු කර නොගැනීමට හේතු කවරේද;

(vi) සාමාජිකයින්ගේ එකතු කරගෙන නොමැති මුදල් ප්‍රමාණයෙහි වටිනාකම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2337/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාව යටතේ වැඩිහිටියන්ගේ මානසික සුවය ආරක්ෂා කිරීමට විශේෂ සෞඛ්‍ය මධ්‍යස්ථාන රටපුරා අරඹන බවට පොරොන්දුවක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම විශේෂ සෞඛ්‍ය මධ්‍යස්ථාන ආරම්භ කිරීමට මේ වන විට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම මධ්‍යස්ථාන ආරම්භ කරන දිස්ත්‍රික්ක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 නොවැම්බර් මස 28 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1944/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන මාර/දෙයියන්දර ප්‍රාථමික විද්‍යාලය දැනට පිහිටා ඇති ස්ථානයෙන් වෙනත් ප්‍රදේශයකට රැගෙන යැමේ සූදානමක් තිබේද;

(ii) එසේ නම්, එම පාසල නැවත ස්ථාපනය කරන ස්ථානය කවරේද;

(iii) ඒ සඳහා සැලසුම් සකස් කර තිබේද;

(iv) ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(v) එසේ නම්, නව පාසලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2277/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ සිටින කිසිදු ආදායමකට හිමිකම් නොකියන, ආබාධිත පුද්ගලයින් හා වයෝවෘද්ධ පුද්ගලයින් සහිත පවුල් සංඛ්‍යාව ආසන්න වශයෙන් කොපමණද;

(ii) 2005 මහින්ද චින්තන ප්‍රකාශනයේ සඳහන් "කිසිදු ආදායමකට හිමිකමක් නොලබන ආබාධ සහිත පුද්ගලයන් සිටින පවුලක් සඳහා මසකට රුපියල් 3,000 ක් ලබා දෙන්නෙමි." යන පොරොන්දුව පරිදි මේ වනවිට එම මුදල ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම ප්‍රතිලාභය ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම මුදල් ලබාදීම වෙනුවෙන් වාර්ෂිකව වැයකරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත (අ)(ii) හි සඳහන් පොරොන්දුව මේ වනවිට ක්‍රියාත්මක නොවන්නේ නම්, ඊට හේතු කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2315/'12

ගරු රවී කරුණානායක මහතා,— කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1958 සේවක අර්ථසාධක අරමුදල පනත 2012 ජනවාරි මස 18 වැනි දින සංශෝධනය කළ බවත්;

(ii) සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ඉඩමක් මිලදීගැනීමට සහ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට යොදා ගැනීම සඳහා එම සංශෝධනය සිදු කළ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය කොපමණද;

(ii) එම ගොඩනැගිල්ලේ වර්ග අඩියක් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(iii) එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ අයගේ නම් සහ ඔවුන් ඉදිරිපත් කරන ලද මිල ගණන් වෙන් වශයෙන් කවරේද; සහ

(iv) එම ගොඩනැගිල්ල මහල් තිස් පහකින් සමන්විත විය යුතු බවට යෝජනා කිරීමේ වගකීම් භාර ගත යුතු පුද්ගලයාගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ගොඩනැගිලි ඉදිකිරීම වැනි කාර්යයකට යොදවා නාස්තියක් සිදුකිරීමට හේතු කවරේද;

(ii) ඉහත සඳහන් කාර්යය සඳහා රාජ්‍ය මුදල් යොදා නොගැනීමට හේතුව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2339/’12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාව මගින් හෘදයාබාධ රෝගීන් ඇතුළු මානසික විවේකය අවශ්‍ය රෝගීන් සඳහා එළිමහන් උද්‍යාන රෝහල් පළාතකට එක බැගින් පිහිටුවීමට යෝජනා කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට එම රෝහල් ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම රෝහල් ඉදිකිරීම ආරම්භ කර ඇති පළාත් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 නොවැම්බර් මස 29 වැනි බ්‍රහස්පතින්දා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1945/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ, කටුපොත නගරයේ ඉදිකර ඇති බස් නැවතුම්පළ මීට වර්ෂ දාහතරකට පමණ පෙර විවෘත කළ බවත්;

(ii) විවෘත කළ දින සිට භාවිතයට නොගැනීම නිසා වෙළෙඳ කුටි 12 ක් ඇතුළු එම ගොඩනැගිලි විනාශවෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම බස් නැවතුම්පළ හා වෙළෙඳ කුටි ප්‍රයෝජනයට නොගෙන අතහැර දැමීමට හේතු කවරේද;

(ii) එම ගොඩනැගිලි නැවත ප්‍රතිසංස්කරණය කර ජනතා අයිතියට පවරාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2280/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ පාසල් ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය ඇති කිරීම සඳහා පුහුණු මධ්‍යස්ථාන ඇති කරන ලද වර්ෂය කවරේද;

(ii) දිවයින පුරා පිහිටුවා ඇති එම පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) ආරම්භක වර්ෂයේ සිට එකී මධ්‍යස්ථාන සඳහා පත්කර ඇති කළමනාකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම කළමනාකරුවන් අධ්‍යාපනඥ සේවයට ඇතුළත්කර තිබේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ආරම්භක වර්ෂයේ සිට මේ දක්වා එම මධ්‍යස්ථාන මගින් ගුරුවරුන්ට වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය;

(ii) ආරම්භක වර්ෂයේ සිට මේ දක්වා එම මධ්‍යස්ථාන මගින් වෘත්තීය පුහුණුව ලබා දී ඇති ගුරුවරුන් සංඛ්‍යාව ;

කොපමණද යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2316/'12

ගරු රවී කරුණානායක මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තැපැල් දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) මනා ලෙස තැපැල් සේවාවන් ලබාදීම සඳහා අවශ්‍යවන සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් දිස්ත්‍රික්කය සඳහා අවශ්‍යවන තැපැල් දෙපාර්තමේන්තු සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) තැපැල් තේරීම් කටයුතු වඩා කඩිනමින් ඉටුකිරීම සඳහා තැපැල් සේවාව ස්වයංක්‍රියකරණය කළ හැකිද;

(ii) තැපැල් දෙපාර්තමේන්තුවේ තථ්‍ය පිරිවැයට වඩා ආදායම අඩුවීම හේතුවෙන් පසුගිය දෙවර්ෂය තුළ රජයට සිදුවූ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2341/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාව මගින් මත්පැන්, මත්ද්‍රව්‍ය හා මත්ගතිය ඇති කරන ඖෂධ වර්ග භාවිතයන්ට තරුණ තරුණියන් යොමු වීම වැළැක්වීම සඳහා දීප ව්‍යාප්ත වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට පොරොන්දුවක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මේ වනවිට එම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත්නම්, එහි ප්‍රගතිය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2012 නොවැම්බර් මස 30 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1946/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට වර්ෂයක පමණ කාලයක සිට, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන පිහිටා ඇති සුදු කොහු කර්මාන්තශාලාව වසා දමා ඇති බැවින් ප්‍රදේශයේ විශාල ජනතාවකට රැකියා අහිමිව දැඩි ආර්ථික දුෂ්කරතාවන්ට මුහුණපෑමට සිදුවී ඇති බවත්;

(ii) එම සුදු කොහු කර්මාන්තශාලාව ආශ්‍රිත මධ්‍යස්ථානය මගින් රැකියා නොමැති තරුණ තරුණියන් ස්වයං රැකියාවලට යොමුකිරීමේ අරමුණින් පුහුණු පාඨමාලාවක් ද පවත්වාගෙන ගිය බවත්;

(iii) නව නිර්මාණ සඳහා ජනාධිපති සම්මාන පවා හිමි කරගත් එම ආයතනය වසා දැමීම ජාතික අපරාධයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, නැවතත් මෙම කර්මාන්තශාලාව ආරම්භ කරන්නේද;

(ii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2281/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විවිධ පෞද්ගලික ආයතන හරහා රාජ්‍ය අංශයේ සේවය කරන මිනිස්බල සේවක සේවිකාවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට ලබා දෙන උපරිම දෛනික හෝ මාසික වැටුප/දීමනාව හා ඊට අදාළ තනතුර කුමක්ද;

(iii) ඔවුන්ට ලබා දෙන අවම දෛනික හෝ මාසික වැටුප/දීමනාව හා ඊට අදාළ තනතුර කුමක්ද;

(iv) ඔවුන් වෙනුවෙන් ලබාදෙන වැටුප/දීමනාව වර්තමාන ආර්ථික පසුබිම මත ප්‍රමාණවත් නොවන හෙයින් එකී වැටුප්/දීමනා ඉහළ දැමීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එය සිදුකරන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සේවකයින්ගෙන් 2005 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය අංශය වෙත බඳවාගෙන ඇති සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම මිනිස්බල සේවකයින් සියලු දෙනාටම හෝ යම් කොටසකට රාජ්‍ය අංශයේ ස්ථිර පත්වීම් ලබාදීමට ඉදිරියේදී කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම කාල වකවානුව කවරේද;

(iv) බඳවා ගන්නා සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2318/'12

ගරු රවී කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 වර්ෂයට අදාළව,

(i) නිවාස ඉදිකිරීම වෙනුවෙන් ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය විසින් වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස ඉදිකරනු ලැබ ඇති ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සඳහන් කරන්නෙහිද?

(ආ) 2012 වර්ෂයට අදාළව,

(i) නිවාස සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) මේ වන විට ඒ සඳහා වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) අලුතින් ඉදිකරන ලද නිවාස පිහිටා ඇති ස්ථාන කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2343/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාව මගින් ලංකාවේ උපදින සෑම දරුවකුගේම ජීවදත්ත ගොනුවක් එම දරුවාගේ ස්ථිර පදිංචියට අදාළ ජන සභා ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යා යුතු බවට යෝජනාවක් ඉදිරිපත් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එම යෝජනාව ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ වර්ෂය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 දෙසැම්බර් මස 03 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1947/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටි, කපුදූව පේෂකර්ම මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සහ එහි උපකරණ මේ වන විට විනාශවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එහි ඇති සම්පත් යොදාගෙන නැවත එම පුහුණු මධ්‍යස්ථානය යථා තත්ත්වයට පත්කිරීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, එම ස්ථානය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකට හෝ වෙනත් කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2320/'12

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එළවළු ප්‍රවාහනය කිරීම සඳහා, 2012 ජනවාරි මස 15 වැනි දින සිට හඳුන්වා දෙන ලද කූඩ ක්‍රමය ක්‍රියාත්මක වෙමින් පවතින ආකාරය කවරේද;

(ii) කූඩ ක්‍රමය හඳුන්වා දීමෙන් පසුව, නරක් නොවී ඉතිරිකර ගනු ලබන එළවළු ප්‍රතිශතය සහ ඒවායේ වටිනාකම රුපියල්වලින් කොපමණද;

(iii) ඉහත සඳහන් ඉතිරිය විගණනය කරනු ලබන ක්‍රමය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කූඩ ක්‍රමය ක්‍රියාත්මක කිරීම නිසා එළවලුවල මිල පහත බැස තිබේද;

(ii) එසේ නම්, මිල ගණන් අඩු වී ඇති ප්‍රමාණයන් ඒ බව තහවරු කළ හැකි සාක්ෂිද සහිතව කවරේද;

(iii) ගොවියන් වෙත නැවත කූඩ ප්‍රවාහනය කිරීම සඳහා වැයවන වියදම දැරීම සම්බන්ධයෙන් වගකීම භාර ගන්නා පුද්ගලයාගේ නම කවරේද;

(iv) ගොවියන් වෙත නැවත කූඩ ප්‍රවාහනය කිරීම සඳහා වර්ෂයකට වැයවන වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2355/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ රෝහල්වල කාර්ය මණ්ඩල සේවයට වාර්තාකිරීම සටහන් කිරීම සඳහා 2006 වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී ස්ථාපනය කරන ලද ඇඟිලි සලකුණු යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම යන්ත්‍ර මිලදීගැනීමට සහ ස්ථාපනය කිරීමට වැය වූ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදීගැනීමේදී ටෙන්ඩර් පරිපාටියක් අනුගමනය කර තිබේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කළ ආයතන හා එක් එක් ආයතනය ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

(iii) ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදීගත් ආයතනයේ නම කුමක්ද;

(iv) එක් යන්ත්‍රයක මිල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ස්ථාපනය කරන ලද ඇඟිලි සලකුණු යන්ත්‍රවලින් දැනට ක්‍රියාත්මකව පවතින යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම යන්ත්‍ර වෙනුවෙන් වැය කළ විශාල මුදලට සාපේක්ෂව ප්‍රමාණවත් ප්‍රතිලාභ ලැබී තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2372/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 07, ටොරින්ටන්හි, 187 වත්තේ පැල්පත් නිවාස හිමි සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නිවාස සඳහා ස්ථිර අයිතිවාසිකම් හෝ බලපත්‍ර ලබා දී තිබේද;

(iii) එසේ නම්, ඔවුන් එම හිමිකම් භුක්ති විඳිමින් සිටින කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත නිවාස කඩා ඉවත්කිරීමට රජය විසින් යම් තීන්දුවක් ගෙන තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ට එම ස්ථානයේම හෝ වෙනත් ස්ථානයක නව නිවාස ලබා දෙන්නේද;

(iii) වෙනත් ස්ථානයක නව නිවාස ලබාදෙන්නේ නම්, එම ස්ථානය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නව නිවාස සංකීර්ණයක් ඉදිකර එම නිවාස මුදල් අය නොකර 187 වත්තේ පදිංචිකරුවන්ට ලබා දීමට යෝජනාවක් ඉදිරිපත්වී තිබුනේද;

(ii) එසේ නම්, එම යෝජනාව මෙතෙක් ක්‍රියාත්මක නොවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 දෙසැම්බර් මස 04 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1948/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල මහ රෝහලෙහි ප්‍රමාණවත් තරම් ගොඩනැගිලි, රෝහල් ඇඳන් සහ අනෙකුත් භෞතික සම්පත් නොමැති බවත්;

(ii) එම තත්ත්වය නිසා ප්‍රදේශයේ රෝගී ජනතාව දැඩි පීඩාවට පත්ව සිටින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම රෝහලට අවශ්‍ය සම්පත් ලබාදීමට කඩිනමින් කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මේ වන විටත් වෙන්කර තිබේද;

(iii) එසේ නම්, වෙන්කර ඇති මුදල කොපමණද;

(iv) අරමුදල් තිබේ නම්, ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2321/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලොව බොහෝ රටවල සිදු කරන අයුරින් ශ්‍රී ලංකාව තුළ විද්‍යුත් ඡන්ද ක්‍රමය ක්‍රියාත්මක කිරීමට හැකියාව තිබේද;

(ii) අවම දෝෂ සහිතව විද්‍යුත් ඡන්ද ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීමේදී ඉන්දියාව සතු අත්දැකීම් සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකාව තුළ එම ඡන්ද ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ සහය ලබාගත හැකිද;

(iii) අවුරුද්දේ එක් මාසයක් තුළ ඡන්ද හිමි ලියාපදිංචිය යාවත්කාලීන කිරීම වෙනුවට විවෘත ඡන්දහිමි ලියාපදිංචි ක්‍රමයක් ස්ථාපනය කළ හැකිද;

(iv) පරිගණක ගත කරන ලද ඡන්ද හිමි නාමලේඛනය දේශපාලන පක්ෂ වෙත ලබාදිය හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2357/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට මහ රෝහලේ සෞඛ්‍ය ලිපිකරුවකු ලෙස සේවය කර 2008.12.09 දින විශ්‍රාම ගොස් ඇති මාතර, කෝට්ටගොඩ, පොහොසතුගොඩ, "සෙවන" නිවසෙහි පදිංචි ඒ. කේ. ඒ. පියදාස කොඩිතුවක්කු මහතාට විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් පාරිතෝශික මුදල හෝ වෙනත් කිසිදු දීමනාවක් මෙතෙක් ගෙවා නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කොඩිතුවක්කු මහතාගේ විශ්‍රාම වැටුප ගෙවීම ප්‍රමාදවීමට හේතුව කවරේද;

(ii) එම විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ කටයුතු පැහැර හරිනු ලබන නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරන්නේද:

(iii) කොඩිතුවක්කු මහතාගේ විශ්‍රාම වැටුප කඩිනමින් ගෙවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2374/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ;

(i) නම් කවරේද;

(ii) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iii) වැටුප්, වේතන සහ දීමනාවල අගයන් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සමාගමේ සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ වැටුප්, වේතන හෝ දීමනා;

(i) පසුගිය කාලවකවානුවේදී වැඩිකර තිබේද;

(ii) වැඩිකර තිබේ නම්, එය සිදුකර ඇති දිනය කවරේද;

(iii) එසේ වැඩි කිරීමට පෙර පැවති ඒවායේ අගයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2012 දෙසැම්බර් මස 05 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1950/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඔයාමඩුව ප්‍රදේශයේ පැවති දැයට කිරුළ ජාතික ප්‍රදර්ශණයට සමගාමීව රජරට ප්‍රදේශයේ මාධ්‍යවේදීන් 15 දෙනෙකුට නිවාස ඉදිකරදීමේ වැඩසටහනක් පැවති බවත්;

(ii) නිවාසලාභීන් තෝරාගැනීමේ දී විනිවිද භාවයකින් තොරව කටයුතු කර ඇති බවට මාධ්‍යවේදීන් චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම නිවාස හිමියන් තෝරාගැනීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(ii) ඉහත වැඩසටහන මගින් මාධ්‍යවේදීන්ට නිවාස ලබාදීමේදී අසාධාරණයක් සිදු වී ඇත්නම් එම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරන්නේද;

(iii) එලෙස කටයුතු කරන්නේ නම්, ඒ සඳහා යොදාගන්නා ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2322/'12

ගරු රවී කරුණානායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010, 2011 සහ 2012 වර්ෂයන්හි පළාත් සභා 9 සඳහා වෙන්කොට ඇති සමස්ත අරමුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත කී වර්ෂයන් තුළ අරමුදල් ලබා දී ඇති, එක් එක් පළාත් සභාවට අයත් අමාත්‍යාංශයන් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2010, 2011 සහ 2012 වර්ෂයන්හිදී,

(i) එක් එක් පළාත් සභාව විසින්, රජයේ ප්‍රතිපාදනවලින් වියදම් කොට ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) පළාත් සභාව විසින්ම උපයාගත් මුදලින් කල වියදම්වල වටිනාකම කොපමණද;

(iii) රජයේ ප්‍රදානයන් සහ ආදායම් බෙදාගැනීම් ලෙස එක් එක් පළාත් සභාව විසින් ලබා ගන්නා ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එක් එක් පළාත් සභාවන්හි අයවැය අවශ්‍යතාවයන්හි හිඟය පියවා ගන්නා ආකාරය කවරේද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) ඉහත කී පළාත් සභාවන්ට මධ්‍යම ආණ්ඩුව සතු බලතල ලබා දීමෙන් අනතුරුව, පළාත් සභාවන්හි ආදායම් එකතු කිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු වී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2363/’12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මූලික රෝහලක් ලෙස උසස් කරන ලද තිස්සමහාරාම රෝහල තුළ,

(i) ශල්‍යාගාරය, ලේ බැංකුව, එක්ස් කිරණ අංශය සහ රසායනාගාර පහසුකම් ස්ථාපිත කර තිබේද;

(ii) ඊ.සී.ජී. ලබාගන්නා නව තාක්ෂණික උපකරණ තිබේද;

(iii) ගැබිනි මව්වරුන් සඳහා චිකිත්සාගාරයක් ඉදිකර ඊට අවශ්‍ය උපකරණ සපයා තිබේද;

(iv) ශල්‍යාගාර වැනි විශේෂිත ඒකක වායුසමනය කර තිබේද;

(v) ප්‍රමාණවත් තරම් උපකරණ හා බෙහෙත් ද්‍රව්‍ය තිබේද;

(vi) පිරිසිදුභාවය රැකීම සඳහා පරිසරය සකස් කර ඒ සඳහා අවශ්‍ය කානු පද්ධති ඉදිකර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) තිස්සමහරාම රෝහලේ දැනට පවතින කානු පද්ධති තුළ බහුලව ඩෙංගු කීටයන් සිටින බවත්;

(ii) මූලික රෝහලකට අවශ්‍ය දුරකථන මධ්‍යස්ථානයක් මේ වනතෙක් එහි ස්ථාපිත කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) තිස්සමහරාම රෝහලේ මෙම අවශ්‍යතාවයන් සපුරාලීමට ගතවන කාලය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2385/’12

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුරයේ පැවති 2012 නිදහස් දින උළෙලේ නර්තන සඳහා ඉදිරිපත් වූ ශිල්පීන් තෝරා ගනු ලැබුවේ කවර ආයතනයන්ගෙන්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිදහස් උළෙලේ නර්තන සඳහා සහභාගී වූ පිරිස කොපමණද;

(ii) නිදහස් දින උත්සවය පැවති දින ඔවුන්ට නරක් වූ ආහාර පාර්සල් ලබා දී තිබේද;

(iii) එසේ නම්, එම ආහාර සැපයුම්කරු කවුරුන්ද;

(iv) එම නර්තන ශිල්පීන්ට ලබා දුන් නරක් වූ ආහාරය වෙනුවට විකල්පයක් ලබා දීම සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග කවරේද;

(v) එම සැපයුම්කරුට එකී ආහාර ඇණවුම ලබා දුන් පුද්ගලයා කවුරුන්ද;

(vi) නරක් වූ ආහාර ලබා දීම සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2012 දෙසැම්බර් මස 06 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1952/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර සිට කතරගම දක්වා දුම්රිය මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අවස්ථා ගණනාවකදී ආරම්භ කළත්, මේ දක්වා එහි කටයුතු අවසන් කර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මාතර සිට කතරගම දක්වා දුම්රිය මාර්ගය ඉදිකිරීම් කටයුතු සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම දුම්රිය මාර්ගයේ කටයුතු සඳහා ප්‍රතිපාදන සපයනු ලබන දේශීය හෝ ජාත්‍යන්තර ආයතනයේ නම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මාතර - කතරගම දුම්රිය මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීමට හේතු සොයා බලා කඩිනමින් එහි කටයුතු ආරම්භ කිරීමට ක්‍රියා කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2323/'12

ගරු රවි කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රට තුළ ඇති ලියාපදිංචි ක්‍රීඩා ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සඳහන් ආයතනවලට නීත්‍යානුකූලව පත්වූ ප්‍රධානීන්ගේ නම් කවරේද;

(iii) ක්‍රීඩා ආයතනවල ප්‍රධානත්වය දරන දේශපාලඥයන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නෛතික අවශ්‍යතාවය පරිදි ක්‍රීඩා ආයතනවල ගිණුම් වාර්ෂිකව ඉදිරිපත්කර තිබේද;

(ii) එසේ නම්, 2010 වර්ෂයට අදාළ ගිණුම් ඉදිරිපත්කර තිබේද;

(iii) අදාළ බලධාරියාට ගිණුම් ඉදිරිපත්කර නොමැති ක්‍රීඩා ආයතනවල නම් කවරේද;

(iv) ඉහත (ආ)(iii)හි සඳහන් එසේ ගිණුම් ඉදිරිපත් නොකළ ක්‍රීඩා ආයතනවලට පැනවූ දඩමුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2367/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී/ස ශ්‍රී ලංකන් ගුවන් සමාගමට අලුතින් ගුවන් යානා ලබා ගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(iii) නොඑසේ නම්, වෙනත් අකාරයකින් ගුවන් යානා ලබාගැනීමට කටයුතු කරන්නේද;

(iv) ගුවන් යානා මිලදී ගන්නේ නම්, ඒ සඳහා වැය වන මුළු මුදල කොපමණද;

(v) එම මුදල් සපයාගනු ලබන ආකාරය කවරේද;

(vi) ගුවන්යානා මිලදීගැනීමට අදාළව තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලන්ඩන් හීත්රෝ ගුවන් තොටුපළ තුළ ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ගුවන් යානා රඳවා ගැනීමට ලබාදී ඇති අවසරය (Slots) බදු දීමට හෝ විකිණීමට අපේක්ෂා කරන්නේද;

(ii) එමිරේට්ස් ගුවන් සමාගම වෙතින් සී/ස ශ්‍රී ලංකන් ගුවන් සමාගම පවරාගත් දින සිට මේ දක්වා ශ්‍රී ලංකන් කේටරින් සමාගම ලබා ඇති ලාභය හෝ පාඩුව කොපමණද;

(iii) ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් කවරේද;

(iv) රජයේ ප්‍රතිපාදන නිදහස් නොකොට එම සමාගම පවත්වාගෙන යාම සඳහා වන විකල්ප ක්‍රියාමාර්ග කෙරෙහි රජයේ අවධානය යොමුකර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2410/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජාතික ගැටලුව සඳහා 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඔබ්බට ගිය විසඳුමක් ලබාදෙන බවට ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමා විසින් ප්‍රකාශ කළ බවට ඉන්දීය විදේශ අමාත්‍යවරයා විසින් මෑතකදී කරන ලද ප්‍රකාශයෙහි සත්‍යතාවයක් තිබේද;

(ii) එම ජාතික ගැටලුව සම්බන්ධයෙන් රජය විසින් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) එසේ නම්, 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අමතරව ලබාදෙන අනෙකුත් යෝජනා කවරේද;

(iv) ඒ සඳහා රජය නියෝජනය කරන සියලූ පක්ෂවල අනුමතිය ලැබී තිබේද;

(v) එම යෝජනා ක්‍රියාත්මක කරන දිනය කවරේද;

(vi) ඉන්දීය විදේශ අමාත්‍යවරයාගේ ඉහත අ(ii) හි සඳහන් ප්‍රකාශය අසත්‍ය නම්, ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 දෙසැම්බර් මස 07 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1954/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර නගර සභාවට අයත් රජයේ තානායම නිසි ප්‍රතිසංස්කරණයක් නොමැතිවීමෙන් දිනෙන් දින විනාශයට පත්වන බවත්;

(ii) සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයවීමත් සමඟ එම තානායම නිසි ලෙස ප්‍රතිසංස්කරණය කිරීම තුළින් විශාල ආදායමක් උපයා ගත හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අම්පාර තානායම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මේ වන විට සැලසුම් සකස් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) ඒ අනුව තානායම සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2359/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෙලින්කෝ සමූහ ව්‍යාපාරයේ මූල්‍යමය ගැටලු පිළිබඳ ප්‍රථමයෙන් වාර්තා වූ දිනය කවරේද;

(ii) ඉහත සමාගමේ බරපතල මූල්‍ය අර්බුදය ශ්‍රී ලංකා මහ බැංකුවට නිල වශයෙන් වාර්තා වූ දිනය කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම අවස්ථාවේ වත්කම් විකුණනු ලැබුවේ නම්, තැන්පත්කරුවන්ට ගෙවීමට හැකිවන මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) වත්කම් විකිණීමෙන් ලැබූ ආදායම කොපමණද;

(iii) මේ දක්වා තැන්පත්කරුවන්ට ගෙවා ඇති මුදල සහ අදාළ තැන්පත්කරුවන්ට ඉතිරි මුදල ගෙවීමට අවශ්‍යවන කාල සීමාව කවරේද;

යන්නද සෙලින්කෝ සමූහ ව්‍යාපාරයේ එක් එක් සමාගමට අදාළව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මේ ආකාරයේ මූල්‍යමය අර්බුදයක් ඇතිවීමට මහ බැංකුව වගකිව යුතුද;

(ii) මහ බැංකුවේ වර්තමාන අධිපතිතුමාගේ නම කවරේද;

(iii) ඉහත සඳහන් මූල්‍ය ගැටලුව ඇතිවන අවස්ථාවේ සිටි මහ බැංකුවේ අධිපතිතුමාගේ නම කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2412/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012.02.11 දින හෝ ආසන්න දිනක සිදුකළ ඉන්ධන මිල වැඩි කිරීමට අනුව මිල වැඩිවූ එක් එක් ඉන්ධන වර්ගය හා ඒවා වැඩිකළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම මිල ගණන් වැඩිකිරීමට හේතු කවරේද;

(iii) එකී මිල ගණන් වැඩිකිරීම අනුමත කළ බලධාරියා කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ඉන්ධන මිල වැඩි කිරීම පසුගිය කාලයේ දී සිදුවූ හෙජින් ගනුදෙනුවෙන් සිදු වූ පාඩුව පියවා ගැනීම සඳහා සිදුකරනු ලැබුවේද;

(ii) නොඑසේ නම්, එම මිල වැඩිකිරීමෙන් ඉටු කර ගැනීමට අපේක්ෂිත කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මහජනයාට දරාගත නොහැකි ලෙස ඉන්ධන මිල වැඩි කිරීම තුළින් ඉන්ධන මත රඳා පවතින, සමස්ත ආර්ථිකයටම හානි සිදු නොවන්නේද;

(ii) එම ඉන්ධන මිල වැඩි කිරීම සංශෝධනය කර පාරිභෝගිකයින්ට සහනයක් ලැබෙන ආකාරයට මිල අඩු කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2429/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ගොවිතැන් නියැලෙන සියලුම ගොවි ජනතාවට ජීවන වියදම් සහනාධාරයක් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක කිරීමට අනුගමනය කරන ක්‍රියා පටිපාටිය කුමක්ද;

(iii) එක් ගොවියකුට ලබාදීමට බලාපොරොත්තුවන සහනාධාර මුදල කොපමණද;

(iv) එම මුදල ගණනය කිරීමට යොදා ගත් නිර්නායකයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 දෙසැම්බර් මස 08 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1956/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, හක්මණ ප්‍රාදේශීය සභාව සඳහා ඉදිකළ නව ගොඩනැගිල්ල විවෘත කර වර්ෂ දෙකක් ගතවීමටත් පෙර බිත්ති ඉරි තලා ගොස්, අවදානම් තත්ත්වයකට පත්වෙමින් පවතින බවත්;

(ii) එම තත්ත්වයට හේතුව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නිසි ප්‍රමිතියකින් තොරව සිදුකිරීම බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ල ඉදිකිරීම් සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(ii) එහි ඉදිකිරීම් කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කළ එක් එක් අයදුම්කරුගේ නම සහ ඉදිරිපත් කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) හක්මණ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු කළ කොන්ත්‍රාත්කරුගේ නම කවරේද;

(ii) ඔහුට මුදල් ගෙවීමට පෙර ඉදිකිරීමට අදාළව කාර්මික නිලධාරී වාර්තාවක් ලබා ගනු ලැබුවේද;

(iii) අදාළ කොන්ත්‍රාත්කරු මගින් නැවතත් එම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2360/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෙලින්කෝ සමූහ ව්‍යාපාරයට සමානව මූල්‍යමය බිඳවැටීමකට ලක්වූ ව්‍යාපාර සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) අද වන විට මෙම සමාගම්වල තත්ත්වය කවරේද;

(iii) බිඳ වැටීමට ලක්වූ එක් එක් සමාගමේ තැන්පතු වෙනුවෙන් තැන්පත්කරුවන්ට ගෙවන ලද මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉතිරි මුදල ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම සමාගම් යළි නගා සිටුවීමට පත්කරන ලද ඇවරකරුවන්ගේ හෝ උපදේශකවරුන්ගේ නම් කවරේද;

(ii) ඉහත සමාගම්වලට ඇතිවූ ගැටලුවලින් කිසිවක් විසඳාගැනීම සඳහා රජය සහාය දක්වා තිබේද;

(iii) එසේ නම්, එය සිදුකරන ලද ආකාරය සහ එම ආධාරවල මූල්‍යමය වටිනාකම කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත මූල්‍ය සමාගම්වල ගැටලු පිළිබඳව අවදියෙන් නොසිටීම නිසා සිය පාර්ශ්වයෙන් සිදු වූ නොසැළකිලිමත්භාවයට ශ්‍රී ලංකා මහ බැංකුව වගකිව යුතු වන්නේද;

(ii) නොඑසේ නම්, ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අපේක්ෂා කරන අධීක්ෂණය කිරීමේ භූමිකාවේ ස්වභාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2414/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ රෝහල් සඳහා ශල්‍ය අත්වැසුම් ආනයනය කරන සමාගම් කවරේද;

(ii) ඉහත එක් සමාගමක් විසින් ආනයනය කර වැඩි මිලක් නියම කරන ලද අත්වැසුම් තොගයක් රජයේ රෝහල් වෙත ලබා දීම සඳහා අනුමතිය ලබා දී තිබේද;

(iii) එසේ, වැඩි මිලට අත්වැසුම් අලෙවි කරන ඉහත සමාගමේ නම කුමක්ද;

(iv) එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගමේ අත්වැසුම් තොගය මිල දී ගැනීම වෛද්‍ය සැපයුම් අංශය ප්‍රතික්ෂේප කළේද;

(ii) එම අත්වැසුම් තොගය පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුව මිල දී ගෙන තිබේද;

(iii) එසේ නම්, ඊට අදාළ ලේඛන මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iv) ඒ සඳහා අනුමතිය ලබා දුන් බලයලත් නිලධාරියා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පිළිගත් ක්‍රමවේදයන්ට පරිබාහිරව ඉහත සඳහන් අත්වැසුම් මිල දී ගැනීමේ ගනුදෙනුව සිදුකර තිබේ නම්, එයට හේතු කවරේද;

(ii) එවැනි ගනුදෙනුවක් සිදුකර තිබේ නම්, එය සිදු කළ අය සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2507/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටා තිබෙන ඇතාවැටුනවැව විද්‍යාලයේ භෞතික සම්පත් සහ මානව සම්පත් ඌනතාවයන් රැසක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඇතාවැටුනවැව විද්‍යාලයේ පවතින භෞතික සම්පත් හා මානව සම්පත් ඌනතාවයන් කවරේද

(ii) එම අඩුපාඩුකම් සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?